www.AlevelApi.com



අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019

# 23 - දේශපාලන විද්‍යාව - (පැරණි නිර්දේශය)

## ලකුණු බෙදීයාම

---

**I පත්‍රය**

**කාලය පැය 02 යි**

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් **මුළු ලකුණු** 100 **කි.**

**II පත්‍රය**

**කාලය පැය 03 යි**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 03කින් යුක්ත ය.

A කොටස - කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20 කි.

B කොටස - අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 04කි. ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

C කොටස - අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 04 කි. දෙකකට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

**II පත්‍රය සඳහා මුළු ලකුණු** 100 **කි.**

**අවසාන ලකුණු ගණනය කිරීම:** **I පත්‍රය = 100**

**II පත්‍රය= 100**

**අවසාන ලකුණ = 200 ÷ 2 =100**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**පරීක්ෂකවරුන්ට උපදෙස් :**

මෙම සංග්‍රහය තුළ අන්තර්ගත වන්නේ අ.පො.ස. (උ.පෙළ) 2019 අගෝස්තු මාසයේදී පවත්වන ලද විභාගය සඳහා අංක 23 දේශපාලන විද්‍යාව විෂය නිර්දේශයට අයත් පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවල අඩංගු ප්‍රශ්න සඳහා පාලක පරීක්ෂක මණ්ඩලය විසින් සකසන ලද ආදර්ශ පිළිතුරු මාලාව ය. මෙම පිළිතුරු සහකාර පරීක්ෂකවරුන්ට පිළිතුරු ඇගයීම සඳහා මග පෙන්වීමක් පමණක් වේ. පිළිතුරුවල අඩංගු වන්නේ අසා ඇති ප්‍රශ්නයට අදාළ වන මූලික කරුණු පමණි. මෙම කරුණුවලට අමතරව අපේක්ෂකයින් තවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් ඒවායේ අදාළ භාවය සැලකිල්ලට ගෙන ඒ සඳහා ද ලකුණු ලබා දීමට පරීක්ෂකවරයා ක්‍රියාකළ යුතු ය. පිළිතුරු සඳහා ලකුණු ලබා දීමේදී පහත දැක්වෙන කරුණු කෙරෙහි පරීක්ෂවරයා විශේෂයෙන් අවධානය යොමු කළ යුතු ය.

(අ) ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගෙන තිබේද? හැඳින්වීම සහ ආරම්භය මඟින් ඒ බව අවබෝධ කර ගත හැක.

(ආ) ප්‍රශ්නයට අදාළ කරුණු නිවැරදිව තෝරා ගෙන තිබෙනවාද සහ එම කරුණු නිවැරදිව විධිමත් අයුරින් සංවිධානය කොට ඉදිරිපත් කර තිබෙනවාද යන්න.

(ඇ) කරුණු ප්‍රමාණවත් අයුරින් විශ්ලේෂණය කර තිබෙනවාද යන්න.

(ඈ) අවසාන නිගමනයකට එළඹ තිබේද යන්න සහ එම අවසාන නිගමනය තාර්කික සහ හරවත් එකක් වනවාද යන්න.

අපේක්ෂකයින් පිළිතුරු තුළ ඉදිරිපත් කරන කරුණු පිළිබඳව යම් ගැටලු සහගත තත්වයක් පවතින්නේ නම් ඒ පිළිබඳව ප්‍රධාන පරීක්ෂකවරයාගේ අවධානයට ලක් කොට තීරණයක් ගත යුතු ය.

**ප්‍රශ්න පත්‍රවල අභිමතාර්ථ :**

**I වන ප්‍රශ්න පත්‍රය**

සමස්ත නිර්දේශ පත්‍රයටම අදාළවන බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත වේ.

**II වන ප්‍රශ්න පත්‍රය**

A, B හා C යන කොටස් තුනකින් සමන්විතය.

**II වන ප්‍රශ්න පත්‍රය - A කොටස**

සමස්ත නිර්දේශ පත්‍රයම ආවරණය වන කෙටි ප්‍රශ්න 20කින් සමන්විත වේ.

**II වන ප්‍රශ්න පත්‍රය - B කොටස**

දේශපාලන විද්‍යාව විෂය තුළ අන්තර්ගත වන න්‍යායන් සහ ඒවායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම ප්‍රශ්න පත්‍රයේ මෙම කොටසේ අභිමතාර්ථය වේ. මේ අනුව සමහර ප්‍රශ්න මඟින් න්‍යායාත්මක සංකල්ප පිළිබඳව සෘජුව ම අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂාවට භාජනය කෙරෙන අතර තවත් සමහර ප්‍රශ්න මඟින් තෝරාගත් රටවල් කිහිපයක් ආශ්‍රයෙන් න්‍යාය හා භාවිතය අතර පවතින සම්බන්ධතාව පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරේ.

**II වන ප්‍රශ්න පත්‍රය - C කොටස**

මෙම ප්‍රශ්න පත්‍රයේ C කොටසේ අභිමතාර්ථය වන්නේ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවැති යුගයේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් ක්‍රියාවට නැංවූ දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරණවල බලපෑම හා එහි ප්‍රතිඵල පිළිබඳවත්, නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ දේශපාලනය හා ආණ්ඩුක්‍රම වර්ධනය පිළිබඳවත් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක්කිරීම ය. මෙයට අමතරව ශ්‍රී ලංකාව සහ අන්තර්ජාතික සමාජය අතර පවත්නා සම්බන්ධතාවයන්හි ස්වරූපය පිළිබඳව ද අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම තවත් අරමුණක් වේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ $\frac{4}{5}$
............................................................
............................................................

(ii) ............................................................ √ $\frac{3}{5}$
............................................................
............................................................

(iii) ............................................................ √ $\frac{3}{5}$
............................................................
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$

www.alevelapi.com

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

2019.08.16 / 1400 - 1600

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොද දක්වන්න.**
* එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

● අංක **1** සිට **15** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

**1.** දේශපාලනය අධ්‍යයනය කිරීමෙන් සිසුන්ට
A – සමාජය තුළ පවතින බලය සහ අධිකාරය අවබෝධ කර ගැනීමට හැකියාව ලැබේ.
B – යහපත් සහ අයහපත් ආණ්ඩුකරණය වෙන් කොට හඳුනාගැනීමට හැකියාව ලැබේ.
C – වගකීම් සහිත පුරවැසියන් විය හැකි වේ.
D – තමන් තුළ ආධ්‍යාත්මික ගුණය පෝෂණය කරගත හැකි වේ.
E – බල අරගලයේ අන්තර්ගතය විශ්ලේෂණය කිරීමට හැකි වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**2.** දේශපාලනය සැලකිලිමත් වන්නේ,
A – පොදු ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳව ය.
B – ගැටුම් සාමකාමීව විසඳීම පිළිබඳව ය.
C – රාජ්‍යය සහ එහි ආයතන පිළිබඳව ය.
D – රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලිය ගැන ය.
E – මනුෂ්‍ය ජීවිතය තුළ ආගම ඉටු කරන භූමිකාව ගැන ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**3.** නූතන සමාජයන්හි රාජ්‍යය
A – අභ්‍යන්තර සහ බාහිර ස්වාධිපත්‍යය හිමි කරගෙන සිටියි.
B – ආණ්ඩුවට සමාන ය.
C – තම සාමාජිකයන් විය යුත්තේ කවුරුන්දැයි තීරණය කරයි.
D – ජාතික රාජ්‍යය යනුවෙන් ද හැඳින්වේ.
E – බලහත්කාරී බලය පිළිබඳ ඒකාධිකාරයට හිමිකම් කියයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**4.** නූතන සමාජයන්හි ආණ්ඩුව
A – වියුක්ත අදහසකි.
B – වරින්වර වෙනස් කළ හැකි ය.
C – ඒකීය සහ සංඝීය යන ආකාර දෙකට අනුව සංවිධානය කළ හැකි ය.
D – රාජ්‍යයේ නියෝජිතයා ය.
E – රාජ්‍යත්වයේ අත්‍යවශ්‍ය අංගයකි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**5.** සම්භාව්‍ය න්‍යායට අනුව ස්වාධිපත්‍යය
A – රාජ්‍යයේ උත්තරීතර බලය සංකේතවත් කරයි.
B – අන්සතු කළ නොහැකි ය.
C – අවශ්‍ය ඕනෑම විටෙක බෙදිය හැකි ය.
D – නීතියේ උල්පතයි.
E – හිමි වන්නේ පාලකයාට පමණි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**6.** ධනවාදී මතවාදයට අනුව
A – රාජ්‍යය ආර්ථිකය පාලනය කළ යුතු ය.
B – වෙළෙඳපොළ ගනුදෙනු අදෘශ්‍යමාන හස්තයකින් කළමනාකරණය කෙරේ.
C – ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සමාජයේ සෑම ස්ථරයක් වෙතට ම කාන්දු වෙයි.
D – නිෂ්පාදනයේ අරමුණ විය යුත්තේ පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කිරීමයි.
E – නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය පුද්ගල නිදහස වර්ධනය කරයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**7.** ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණවලට අයත් වන්නේ,
A – විධායකය සහ ව්‍යවස්ථාදායකය සඳහා වෙන් වෙන් මැතිවරණ පැවැත්වීම ය.
B – ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීනව විධායකය පැවැතීම ය.
C – ආණ්ඩුව සංවිධානය කිරීමේ දී බලතල වෙන් කිරීමේ සිද්ධාන්තය යොදාගැනීම ය.
D – පක්ෂ දේශපාලන හේතු මත ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කළ නොහැකිය යන මූලධර්මය ය.
E – ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ ධුර කාල සමගාමීව අවසන් වීම ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**8.** විද්‍යාත්මක සමාජවාදය
A – කම්කරු පන්තිය ධනවාදී රාජ්‍යයට අවනත විය යුතු බව කියා සිටියි.
B – රාජ්‍යය යනු අධිපති පන්තියේ බල උපකරණයක් යැයි විශ්වාස කරයි.
C – රාජ්‍යය පවතින්නේ පන්ති සහිත සමාජවල යැයි කියා සිටියි.
D – කොමියුනිස්ට් සමාජය තුළ දී රාජ්‍යය වියැකී යනු ඇතැයි විශ්වාස කරයි.
E – කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ ඉගැන්වීම් මත පදනම් ව ඇත.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**9.** ඒකාධිපති ආණ්ඩුක්‍රමයක ලක්ෂණ වන්නේ,
A – ලිබරල් සමාජ සහ දේශපාලන දර්ශනයක් නොතිබීමයි.
B – මහජන දුක්ගැනවිලිවලට සවන්දීමට උනන්දුවක් නොතිබීමයි.
C – අත්තනෝමතික පාලනයයි.
D – මහජනතාවට වගකීමට පාලකයා සතු කැමැත්තයි.
E – මහජන ජීවිතයේදී ජනමාධ්‍යයට හිමි යටහත් භූමිකාවයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**10.** සංධීය ආණ්ඩුක්‍රම ආකෘතිය යටතේ
A – ආණ්ඩු බලය මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී පවතියි.
B – මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ඇති ආරවුල් ශ්‍රේෂ්ඨාධිකරණය බේරුම් කරයි.
C – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර සහයෝගීතාව අනිවාර්ය වේ.
D – ප්‍රාන්ත රාජ්‍ය තමන් සතු නිශ්චිත අනන්‍යතා තබා ගනිමින් එකමුතුව සිටියි.
E – මධ්‍යම ව්‍යවස්ථාදායකයට ප්‍රාන්ත ව්‍යවස්ථාදායක අභිබවා යා හැකි ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**11.** ශුද්ධ කැබිනට් ආණ්ඩුක්‍රමයක ලක්ෂණ වන්නේ,
A – නාමික සහ සත්‍ය විධායකයක් පැවැතීමයි.
B – අමාත්‍යවරුන්ගේ සාමූහික වගකීමයි.
C – ව්‍යවස්ථාදායකය නොවැදගත් තත්ත්වයට පහත හෙළීමයි.
D – විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර ඇති අන්‍යෝන්‍ය සහයෝගීතා සම්බන්ධතාවයි.
E – ව්‍යවස්ථාදායකය එහි නිල කාලය සම්පූර්ණ වීමට පෙර විසුරුවා හැරීමේ හැකියාවයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**12.** ලිබරල් ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක ලක්ෂණවලට ඇතුළත් වන්නේ,
A – ව්‍යවස්ථානුකූල ආණ්ඩුවයි.
B – ආණ්ඩුවේ ආයතන අතර බලතල වෙන් කිරීමයි.
C – තරඟකාරී දේශපාලන පක්ෂ ක්‍රමයයි.
D – ජනමාධ්‍ය ක්ෂේත්‍රය මත පවතින ආණ්ඩුවේ පාලනයයි.
E – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මූලික අයිතිවාසිකම් සහතික කර තිබීමයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**13.** නීතියේ ආධිපත්‍යය යන සංකල්පය කියා සිටින පරිදි
A – සැම කෙනෙකු ම නීතිය ඉදිරියේ සමාන ය.
B – පාලකයා මෙන් ම පාලිතයා ද රාජ්‍යයේ නීතිවලට අවනත විය යුතු ය.
C – පාලකයා නීතියට බැඳීමෙන් නිදහස් ය.
D – අතීතයට බලපාන නීති පැනවීම නුසුදුසු ය.
E – චූදිතයකු වරදකරුවෙකු බවට ඔප්පු වන තුරු නිර්දෝෂී යැයි සැලකිය යුතු ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**14.** මානව අයිතිවාසිකම්
A – සැම මනුෂ්‍යයකුට ම තමන් මනුෂ්‍යයකු වීම නිසා හිමි වන අයිතිවාසිකම් ය.
B – විශ්වීය ය.
C – අර්ථවත් වන්නට නම් ඒවා නීතියෙන් සහතික කළ යුතු වේ.
D – ජාත්‍යන්තර නීතියේ කොටසකි.
E – රාජ්‍යයක ව්‍යවස්ථාවෙන් පිළිගනු ලැබ ඇති අයිතිවාසිකම් පමණකි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**15.** බලතල වෙන් කිරීමේ සංකල්පය උපකල්පනය කරන පරිදි
A – පුරවැසි නිදහස සහතික කිරීම සඳහා රාජ්‍ය බලය කේන්ද්‍රගත වීම වැළැක්වීම අවශ්‍ය වේ.
B – වෙන් කරනු ලැබූ බලය භාවිත කරනු ලැබිය යුත්තේ ආණ්ඩුවේ වෙන් වෙන් ශාඛාවන් මගිනි.
C – අත්තනෝමතික ආණ්ඩුකරණය වැළැක්වීමට සංවරණ හා තුලන යාන්ත්‍රණ අවශ්‍ය වේ.
D – පරම බලය දූෂණයට තුඩු නොදෙයි.
E – බලය බලයෙන් ම සංවරණය කළ හැකි ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

● අංක **16** සිට **25** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් **නිවැරදි** වන්නේ ප්‍රකාශ හතරක් පමණි. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**16.** නූතන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල පවත්නා ව්‍යවස්ථාදායකය
(1) නීතිය හා සාමය පවත්වා ගැනීමට නීති පනවයි.
(2) ආණ්ඩුව පවත්වා ගැනීමට අවශ්‍ය මහජන මුදල් වෙන් කරයි.
(3) ඒක මාණ්ඩලික හෝ ද්වි මාණ්ඩලික හෝ විය හැකි ය.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නංවයි.
(5) ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

**17.** අධිකරණය පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සම්ප්‍රදායට අනුව
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කළ යුතු ය.
(2) විනිශ්චයකාරවරුන්ගේ ධුර කාලය සුරක්ෂිත කළ යුතු ය.
(3) විනිශ්චයකාරවරුන්ගේ වැටුප් ඔවුන්ගේ ධුර කාලය තුළදී අඩු කළ නොහැකි ය.
(4) විනිශ්චයකාරවරුන් දේශපාලනිකව මධ්‍යස්ථ විය යුතු ය.
(5) විනිශ්චයකාරවරුන් නඩු විසඳීමේදී විධායකයේ අදහස් විමසිය යුතු ය.

**18.** රාජ්‍යය පනවන නීති
(1) ස්වාධිපත්‍යයේ ප්‍රකාශනයි.
(2) සමාජයේ ඇති චාරිත්‍ර වාරිත්‍රවලට සමාන ය.
(3) සමාජයේ සියලු ම සාමාජිකයන් බැඳ තැබෙන ඒවා ය.
(4) පුරවැසියන්ගේ චර්යාව පාලනය කිරීම අරමුණු කර ගනියි.
(5) ආධ්‍යාත්මික ජීවිතයට මග පෙන්වන්නේ නැත.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**19.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයට අනුව
(1) කිසිම පුද්ගලයකුට නීතිය අභිබවා යා නොහැකියි.
(2) ආණ්ඩුව කටයුතු කළ යුත්තේ නීතියට අනුකූලව ය.
(3) පවත්නා දේශපාලන තත්ත්වයන් මත ආණ්ඩුවට පුරවැසි නිදහස නොසලකා හැරිය හැකි ය.
(4) පාලකයාගේ හා පාලිතයාගේ යුතුකම් හා වගකීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දැක්විය යුතු ය.
(5) පාලකයන්ගේ සහ ආණ්ඩුවේ ආයතනවල චර්යාව පුරෝකථනය කළ හැකි විය යුතු ය.

**20.** සිවිල් සමාජය
(1) පිහිටා ඇත්තේ රාජ්‍යයේ පරිමණ්ඩලයෙන් පිටත ය.
(2) පුරවැසියන්ගේ ස්වේච්ඡා සංවිධානවලින් සමන්විත වේ.
(3) සෞඛ්‍ය සම්පන්න ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයකි.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියට යෙදවුම් සපයයි.
(5) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට බාධාවකි.

**21.** නූතන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල පවතින නියෝජනය
(1) අත්තනෝමතික පාලනයට මගපාදයි.
(2) පුරවැසියන් සහ ආණ්ඩුව සම්බන්ධ කරවන මාධ්‍යයයි.
(3) සිදු වන්නේ වක්‍ර ක්‍රම මගිනි.
(4) ක්‍රියාත්මක වන්නේ මැතිවරණ මාර්ගයෙනි.
(5) භාරකාරත්වය, අභිනියෝජනය සහ ජනවරම යන ස්වරූප ගත හැකි ය.

**22.** ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
(1) නම්‍ය සහ අනම්‍ය, ඒකීය සහ සංඝීය, ජනාධිපති සහ පාර්ලිමේන්තු යනුවෙන් වර්ගීකරණය කෙරේ.
(2) ආණ්ඩුව සහ මහජනතාව අතර සම්බන්ධතාවේ ස්වභාවය සහ අන්තර්ගතය නිර්ණය කරයි.
(3) ආණ්ඩුවේ ආයතනවල බලතල, කාර්යයන් සහ ක්‍රියාපටිපාටිය නිශ්චය කරයි.
(4) ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයේ සීමාවන් නියම කරයි.
(5) ප්‍රතිෂ්ඨාපිත නීතිවලින් ඔබ්බට ගොස් ක්‍රියා කිරීමට ආණ්ඩුවලට ඉඩ සලසා දෙයි.

**23.** අභිලාෂ (ආශා) කණ්ඩායම්
(1) ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයට ආධාර වේ.
(2) දේශපාලන පක්ෂවලින් වෙන් කොට හඳුනාගත හැකි ය.
(3) සර්වබලධාරී ක්‍රම තුළ පැවැතීමට ඉඩ ලබයි.
(4) ප්‍රතිපත්ති සම්පාදකයන්ට බලපෑම් කිරීමෙන් තම අරමුණු ඉටු කරගැනීමට අපේක්ෂා කරයි.
(5) තම කණ්ඩායම් සාමාජිකයින්ගේ සුබසාධනය ගැන සැලකිලිමත් වෙයි.

**24.** ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල දේශපාලන පක්ෂ
(1) වැදගත් දේශපාලන කරුණු පිළිබඳව මහජනතාවට අධ්‍යාපනය ලබාදෙයි.
(2) දේශපාලන බලය ලබාගැනීම අරමුණු කරගනියි.
(3) දේශපාලන ක්‍රමයට අවශ්‍ය අනාගත නායකයින් බඳවා ගනියි.
(4) ආණ්ඩු පිහිටුවීමේ මාධ්‍යයයි.
(5) ඒකාධිපති පාලනයට මගපාදයි.

**25.** රාජ්‍ය ප්‍රතිපත්ති
(1) පුද්ගලික ව්‍යාපාරික කණ්ඩායම්වලට වාසි සැලසීම අපේක්ෂා කරයි.
(2) මහජන දුක්ගැනවිලි විසඳීම අරමුණු කරගනියි.
(3) නිශ්චිත අරමුණු සහිත ක්‍රියාදාමයකි.
(4) ක්‍රියාත්මක කෙරෙන්නේ නිලබල ක්‍රමය මගිනි.
(5) සම්පාදනය කරනු ලබන්නේ දේශපාලන ක්‍රමයක සිටින මහජන පිළිගැනීම ඇති අධිකාරීන් විසිනි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- අංක **26** සිට **35** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහ බැගින් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් මාතෘකාවට අදාළ වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **අදාළ** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**26.** 1833 කෝල්බෲක් කැමරන් කොමිසමේ නිර්දේශ වූයේ
A – රාජකාරි ක්‍රමය අහෝසි කිරීම ය.
B – විධායක සහ ව්‍යවස්ථාදායක මණ්ඩල පිහිටුවීම ය.
C – පොදු අපරාධ විනිශ්චය ක්‍රමයක් හඳුන්වාදීම ය.
D – සියලු වෙළෙඳ ඒකාධිකාර අවසන් කිරීම ය.
E – අධිකරණය සම්බන්ධව ආණ්ඩුකාරයාගේ බලය ශක්තිමත් කිරීම ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**27.** ලංකා ජාතික සංගමය
A – ඉදිරිපත් කළේ මධ්‍යස්ථවාදී දේශපාලන ඉල්ලීම් ය.
B – ස්වදේශීය ජනතාවට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත්වැසියන් ලෙස සමාන පිළිගැනීමක් ඉල්ලා සිටියේ ය.
C – කුල, ආගමික සහ වාර්ගික අනන්‍යතා අනුව බෙදී තිබිණ.
D – සාමාන්‍ය මහජනතාව දේශපාලන නිදහස උදෙසා සංවිධානය කළේ ය.
E – බ්‍රිතාන්‍ය පාලනය වහාම ඉවත් කරගත යුතු යැයි ඉල්ලා සිටීමෙන් වැළකී සිටියේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**28.** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ
A – සර්වජන ඡන්දබලය හඳුන්වා දුන්නේ ය.
B – විධායක කාරක සභා ක්‍රමය පිහිටුවී ය.
C – ස්වදේශීය දේශපාලන නායකයින්ට ආණ්ඩුවේ කටයුතුවලට සහභාගි වීමේ හැකියාව ලබා දුන්නේ ය.
D – රාජ්‍ය නිලධාරීන් තිදෙනා අධිරාජ්‍ය අභිලාෂ ආරක්ෂා කළ යුතු යැයි අපේක්ෂා කළේ ය.
E – ආණ්ඩුකාරයා ආණ්ඩුවේ නාමික ප්‍රධානියාගේ තත්ත්වයට පත් කළේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**29.** සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පැවැති පාර්ලිමේන්තුව
A – ඕනෑම නීතියක් පැනවීමේ හෝ අවලංගු කිරීමේ හෝ බලය භුක්ති වින්දේ ය.
B – සමන්විත වූයේ කිරීටය නියෝජනය කළ අග්‍රාණ්ඩුකාරයා, සෙනෙට් සභාව සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යන ඒවායින් ය.
C – තෝරාපත් කරගනු ලැබූ සහ නම් කරනු ලැබූ සාමාජිකයන්ගෙන් සමන්විත විය.
D – තම ව්‍යවස්ථාදායක බලය පිළිබඳ සීමාවන්ට මුහුණ පෑවේ ය.
E – ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් විය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**30.** ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා
A – රාජ්‍යයේ නාමික ප්‍රධානියා විය.
B – නම් කරනු ලැබුවේ අග්‍රාමාත්‍යවරයා/වරිය විසිනි.
C – ජාතික රාජ්‍ය සභාවේ සම්මත කරනු ලැබූ යෝජනාවක් මගින් ඉවත් කළ හැකි විය.
D – නිලකාලය තුළදී නෛතික මුක්තියට හිමිකම් කීවේ ය.
E – ජාතික රාජ්‍ය සභාව කැඳවීමේ සහ විසුරුවා හැරීමේ අභිමතානුසාරී බලය හිමිව සිටියේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**31.** 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාව
A – විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලයට හිමිකම් කී ය.
B – රාජ්‍යයේ උත්තරීතර ආයතනය විය.
C – රාජ්‍ය සේවය පාලනය කිරීමේ බලය සහිත විය.
D – ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් විය.
E – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට වග උත්තර කිව යුතු විය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**32.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව අංග වූයේ
A – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ය.
B – සමානුපාතික නියෝජන ක්‍රමය ය.
C – මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධව නීතිමය පිළියම් ය.
D – ඔම්බුඩ්ස්මන්වරයා ය.
E – ජනාධිපති කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**33.** ඇමෙරිකා එක්සත් ජනපදයේ සංඝීය ක්‍රමය
A – ප්‍රාන්ත රාජ්‍ය පනහකින් සහ මධ්‍යම ආණ්ඩුවෙන් සමන්විත වේ.
B – හවුලේ බෙදාගත් ස්වාධිපත්‍යය ලක්ෂණ කොට ගෙන ඇත.
C – ශේෂ බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට පවරා ඇත.
D – සංඝීය ආණ්ඩුවේ සාමාජිකත්වයෙන් ඉවත් වීමට ප්‍රාන්ත රාජ්‍යවලට අවකාශ සපයා ඇත.
E – පෙර පැවැති සහසංඝීය ක්‍රමය වෙනුවට පිහිටුවනු ලැබිණ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**34.** බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම සම්ප්‍රදායට අනුව
A – රජිනට හිමිව ඇත්තේ ආණ්ඩුව සම්බන්ධව නාමික බලතල පමණි.
B – පාර්ලිමේන්තුවට අනාගත පාර්ලිමේන්තුවක් බැඳ තබන තීරණ ගත නොහැකි ය.
C – දෙවන මණ්ඩලය පාර්ලිමේන්තුවේ අංගයක් නොවේ.
D – අග්‍රාමාත්‍යවරයා සමානයන් අතර ප්‍රථමයා ය.
E – පාර්ලිමේන්තුවට ඕනෑම නීතියක් පැනවීමට හෝ අවලංගු කිරීමට හෝ හැකි ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**35.** ගෝලීයකරණය
A – නූතන රාජ්‍යයේ ස්වාධිපත්‍යය අභියෝගයට ලක් කර ඇත.
B – මෙහෙයවනු ලබන්නේ නව ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ මගිනි.
C – නූතන රාජ්‍යය සංඝීය රාජ්‍යයක් විය යුතු යැයි යෝජනා කරයි.
D – පාරජාතික ජාලයන්ගෙන් සමන්විත වන නව ක්‍රමයකි.
E – ගෝලීය ප්‍රාග්ධන ගලා යාම තුළින් ජාතික රාජ්‍යවල බලය සීමා කරයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

- අංක **36** සිට **40** තෙක් ඇති ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ප්‍රකාශ පහ බැගින් දී ඇත. ඒවායේ **සාවද්‍ය** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**36.** වර්තමාන ජාත්‍යන්තර ක්‍රමය තුළ
A – එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක ආණ්ඩුව ලෙස ක්‍රියා කරයි.
B – ඇමෙරිකා එක්සත් ජනපදය ලෝක නායකයා ලෙස සෑම රටක් විසින්ම පිළිගනු ලැබ ඇත.
C – ඉන්දියාව සහ ජර්මනිය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර සාමාජිකයින් ය.
D – එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝකයේ සාමූහික ආරක්ෂාව සඳහා වග කියයි.
E – සාක් සංවිධානයේ සාමාජික රටවල් සහසංඝීය රාජ්‍ය මණ්ඩලයක් පිහිටුවා ගෙන ඇත.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**37.** සමකාලීන ජාත්‍යන්තර ක්‍රමයේ ලක්ෂණ වී ඇත්තේ
A – එක්සත් ජාතීන්ගේ සංවිධානයට තම ස්වාධිපත්‍යය යටත්කොට ඇති ජාතික රාජ්‍ය ක්‍රමයක් පැවැතීමයි.
B – විශාල හා කුඩා රාජ්‍ය අතර යුද්ධයෙන් තොර සාමකාමී සහජීවනයක් පැවැතීමයි.
C – චීනය නව ගෝලීය සුපිරි බලවතා ලෙසට සෑම රාජ්‍යයක් විසින් ම පිළිගනු ලැබීමයි.
D – බහු ධ්‍රැවීය ලෝක ක්‍රමයක් පැවතීමයි.
E – ද්වි ධ්‍රැවීය ලෝක ක්‍රමයක් පැවතීමයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**38.** ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම මාදිලිය
A – අර්ධ සංඝීය ක්‍රමයකි.
B – වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රමයට සජීවී නිදසුනකි.
C – සාමූහික විධායක ක්‍රමය ප්‍රතික්ෂේප කොට ඇත.
D – කැන්ටන් පනවන නීතිවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලත්වය තීරණය කිරීමේ බලය ෆෙඩරල් අධිකරණයට පවරා ඇත.
E – කැන්ටන්වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පැනවීමේ බලය මධ්‍යම ආණ්ඩුවට පවරා දෙයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**39.** ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය
A – රට, සංඝීය රාජ්‍යයක් බවට පරිවර්තනය කොට ඇත.
B – හඳුන්වා දෙන ලද්දේ රටෙහි ජනවාර්ගික ගැටලුව විසඳීම සඳහා ය.
C – සෙනෙට් මණ්ඩලයක් බිහි කර ඇත.
D – ආණ්ඩුකාරයා ප්‍රධානත්වය දරන අමාත්‍ය මණ්ඩලයක් නිර්මාණය කර ඇත.
E – පළාත් සභාවලට පූර්ණ ව්‍යවස්ථාදායක බලය ලබා දී ඇත.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**40.** නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල මිශ්‍ර විධායක ක්‍රමය
A – ජනාධිපති සහ කැබිනට් ආණ්ඩුක්‍රම මිශ්‍ර කිරීමට ඉඩ නොතබයි.
B – අවශ්‍ය වූ විට ජනාධිපතිවරයා ඉක්මවා යාමට අග්‍රාමාත්‍යවරයාට ඉඩ සපයයි.
C – ජනාධිපතිවරයකු, අග්‍රාමාත්‍යවරයකු සහ කැබිනට් මණ්ඩලයක් සඳහා විධිවිධාන සපයයි.
D – අමාත්‍යවරුන් තම අභිමතය පරිදි තෝරාගැනීමට ජනාධිපතිවරයා/වරියට හැකියාව ලබා දෙයි.
E – ව්‍යවස්ථාදායකයේ විශ්වාසය නොමැතිව පැවැතීමට අමාත්‍ය මණ්ඩලයට අවකාශ ලබා දෙයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

- අංක **41** සිට **45** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**41.** අර්ධ සංඝීය ආණ්ඩුක්‍රමය
(1) ඒකීය සහ සංඝීය ලක්ෂණ සහිත ය.
(2) ප්‍රංශයේ සහ ශ්‍රී ලංකාවේ පවතියි.
(3) ඉන්දියාවේ සාර්ථකව ක්‍රියාත්මක වී තිබේ.
(4) මධ්‍යම සහ ප්‍රාන්ත මට්ටමේ පුරවැසිභාවයන් දෙකකට ඉඩ සලසන්නේ නැත.
(5) හදිසි අවස්ථා තත්ත්වයන් යටතේ ඒකීය ආණ්ඩුවක් ලෙස ක්‍රියා කරයි.

**42.** යුරෝපා සංගමය
(1) මහා බ්‍රිතාන්‍යයේ සාමාජිකත්වය පිළිබඳව ගැටලුවකට මුහුණ දී සිටියි.
(2) යුරෝපීය රාජ්‍යයන් අතර සහයෝගීතාව ගොඩ නැගීමට ක්‍රියාකරමින් සිටී.
(3) බ්‍රසල්ස් නුවර මූලස්ථානය කොට ගෙන ඇත.
(4) පොදු පාර්ලිමේන්තුවක් ඇති අන්තර් රාජ්‍ය සංවිධානයකි.
(5) මානව දයාවාදී සංවිධානයකි.

**43.** යටත්විජිත යුගයේ ශ්‍රී ලංකාවේ පැවැති වාර්ගික නියෝජන ක්‍රමය
(1) රටට හඳුන්වා දෙන ලද පළමුවන නියෝජන ක්‍රමයයි.
(2) සුළු වාර්ගික කණ්ඩායම්වල සහය ලැබීය.
(3) බ්‍රිතාන්‍යයන්ගේ බෙදා පාලනය කිරීමේ ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් විය.
(4) හොඳම ප්‍රජාතන්ත්‍රවාදී නියෝජන ක්‍රමයක් ලෙස සැලකේ.
(5) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් අහෝසි කරනු ලැබිණි.

**44.** ශ්‍රී ලංකාවේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව
(1) 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කෙරිණි.
(2) සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත ය.
(3) පාර්ලිමේන්තුවේ කථානායකවරයා එහි සභාපතිවරයා ලෙස සලකයි.
(4) රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය සහතික කිරීම අරමුණු කරයි.
(5) උසස් රාජ්‍ය නිලධාරීන් සිය අභිමතය පරිදි පත් කිරීමට ජනාධිපතිවරයාට බලය පවරයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**45.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමය
(1) ආණ්ඩු ව්‍යුහයේ තෙවැනි තලයයි.
(2) නියාමන සහ පරිපාලන බලතල භුක්ති විඳියි.
(3) මිශ්‍ර මැතිවරණ ක්‍රමයකින් සාමාජිකයින් තෝරාපත් කිරීමට අවකාශ සපයයි.
(4) මධ්‍යම ආණ්ඩුවේ සෘජු අධීක්ෂණය යටතේ පවතියි.
(5) ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කරතැයි අපේක්ෂා කෙරේ.

- අංක **46** සිට **50** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4), සහ (5) යන වරණවලින් කවර වරණයදැ'යි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **46.** | ශ්‍රී ලංකාවේ, දෙවන ජනරජ ව්‍යවස්ථාවට සිදු කළ දහනව වන සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා පත් කරනු ලැබේ. | පාර්ලිමේන්තුවේ උපරිම විශ්වාසය ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය. |
| **47.** | 1978 ව්‍යවස්ථාවේ දහඅට වන සංශෝධනය ස්වාධීන කොමිෂන් සභා දුර්වල කළේ ය. | දහ අටවන ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ ධූර වාර ගණන පිළිබඳ සීමා ඉවත් කෙරිණි. |
| **48.** | 1978 ව්‍යවස්ථාවේ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙනු ලැබිණි. | පළාත් සභා ක්‍රමය ඉන්දියානු සංධීය ක්‍රමයට සෑම අතින්ම සමාන ය. |
| **49.** | දෙවන ජනරජ ව්‍යවස්ථාව ද්වි-මාණ්ඩලික ව්‍යවස්ථාදායක් සඳහා විධිවිධාන සැලසී ය. | දෙවන ජනරජ ව්‍යවස්ථාවෙහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය, කණ්ඩායම් අයිතිවාසිකම් පිළිගෙන තිබේ. |
| **50.** | 1978 මුල් ව්‍යවස්ථාව, පාර්ලිමේන්තු මැතිවරණ සඳහා මනාප ක්‍රමය සමග සමානුපාතික නියෝජනය හඳුන්වා දුන්නේ ය. | සමානුපාතික නියෝජන ක්‍රමය, පක්ෂ නායකත්වයේ බලය වර්ධනය කළේ ය. |

* * *



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019**

**පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்**

| විෂයය අංකය / பாட இலக்கம் | 23 | විෂයය / பாடம் | දේශපාලන විද්‍යාව |
|---|---|---|---|

**ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்**
**I පත්‍රය/பத்திரம் I**

| ප්‍රශ්න අංකය වினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 1 | 31. | 1 | 41. | 2 |
| 02. | 1 | 12. | 2 | 22. | 5 | 32. | 5 | 42. | 5 |
| 03. | 4 | 13. | 3 | 23. | 3 | 33. | 2 | 43. | 4 |
| 04. | 5 | 14. | 1 | 24. | 5 | 34. | 3 | 44. | 5 |
| 05. | 3 | 15. | 2 | 25. | 1 | 35. | 3 | 45. | 4 |
| 06. | 5 | 16. | 4 | 26. | 1 | 36. | 2 | 46. | 5 |
| 07. | 1 | 17. | 5 | 27. | 2 | 37. | 2 | 47. | 1 |
| 08. | 5 | 18. | 2 | 28. | 1 | 38. | 2 | 48. | 2 |
| 09. | 2 | 19. | 3 | 29. | 5 | 39. | 4 | 49. | 4 |
| 10. | 1 | 20. | 5 | 30. | 1 | 40. | 3 | 50. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :
එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100



www.alevelapi.com
උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## A කොටස

**1.** ප්‍රජාතන්ත්‍රවාදය සම්භාව්‍ය ග්‍රීක යුගයේ සිට නූතන යුගය දක්වා සිදු වූ විකාශනයේදී ස්වරූප දෙකකින් පැවත තිබේ. එම ස්වරූප **දෙක** මොනවා ද?

1. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය/ සෘජු
2. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය/ වක්‍ර/ නියෝජන

**2.** සම්භාව්‍ය ග්‍රීසියේ සිටි දේශපාලන චින්තකයින් දෙදෙනෙකු දේශපාලන අධ්‍යයනයේ පුරෝගාමීන් ලෙස සැලකෙති. ඒ **දෙදෙනා** නම් කරන්න.

1. ප්ලේටෝ
2. ඇරිස්ටෝටල්

**3.** දේශපාලන චින්තනයේ සංවර්ධනයට දායක වූ ඉපැරණි ඉන්දීය සහ චීන දේශපාලන චින්තකයකු බැගින් නම් කරන්න.

1. ඉන්දියාව - කෞටිල්‍ය/ මනු/ චානක්‍ය
2. චීනය - කොන්ෆියුසියස් / ලාඕ-ට්සේ

**4.** බ්‍රිතාන්‍ය සමාජ සම්මුතිවාදී චින්තකයින් දෙදෙනෙකු විසින් 'ප්‍රකෘති තත්ත්වය' දෙයාකාරයකට විස්තර කරනු ලැබ ඇත. ඒ **දෙදෙනා** නම් කරන්න.

1. තෝමස් හොබ්ස්
2. ජෝන් ලොක්

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කිරීමේ ක්‍රියාපටිපාටියේ ඇති දුෂ්කරතා මට්ටම පදනම්ව ඒවා වර්ග දෙකකට බෙදනු ලැබේ. එම වර්ග **දෙක** නම් කරන්න.

1. නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ නම්‍ය
2. අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ අනම්‍ය/ නම්‍ය නොවන

**6.** පහත සඳහන් දේශපාලන ආයතන දෙක පිහිටු වූ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා **දෙක** මොනවා ද?

(1) ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය

1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/

1947 ව්‍යවස්ථාව/සෝල්බරි 1948/ 1947

(2) ඔම්බුඩ්ස්මන්වරයා

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ 1978



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**7.** පහත සඳහන් මූලධර්ම අවධාරණය කරන්නා වූ දේශපාලන ක්‍රම **දෙක** නම් කරන්න.

(1) නිදහස, ජීවිතය සහ පුද්ගලික දේපළ පිළිබඳ අයිතිය

ලිබරල්වාදය/ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය/ ප්‍රජාතන්ත්‍රවාදය/ ලිබරල් ක්‍රමය/ ලිබරල්

(2) දේපළ පිළිබඳ සාමූහික අයිතිය

සමාජවාදය/ කොමියුනිස්ට්වාදය

**8.** පහත සඳහන් ප්‍රකාශ රාජ්‍යය පිළිබඳ න්‍යාය දෙකකට සම්බන්ධ ය. ඒවා මොනවා ද?

(1) රාජ්‍යය ක්‍රමික ක්‍රියාවලියක් තුළින් පැන නැගිණ.

සමාජ විකාශනාත්මකවාදය/ රාජ්‍ය පිළිබඳ විකාශනවාදය/ විකාශනාත්මක න්‍යාය/ විකාශනවාදය

(2) රාජ්‍යය පෞද්ගලික දේපළවල සම්භවය සමග පැන නැගිණ.

මාක්ස්වාදය

**9.** පහත සඳහන් සංකල්ප හඳුන්වා දුන් දේශපාලන චින්තකයින් **දෙදෙනා** නම් කරන්න.

(1) දාර්ශනික පාලකයා

ප්ලේටෝ

(2) පොදු කැමැත්ත

ජීන් ජැක්විස් රූසෝ/ ෂොන් ෂාක්වී රූසෝ/ රූසෝ

**10.** ක්‍රි.ව. 2000 න් පසුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද සංශෝධන දෙකක් මගින් ජනාධිපතිවරයා සතු බලතල පහත සඳහන් දෙයාකාරයෙන් වෙනස් කරනු ලැබීය. එම සංශෝධන මොනවා ද?

(1) ජනාධිපතිවරයාගේ බලය ශක්තිමත් කළ සංශෝධනය

18 වන ව්‍යවස්ථා සංශෝධනය/ 18 වන සංශෝධනය/ 18

(2) ජනාධිපතිවරයාගේ බලය අඩු කළ සංශෝධනය

19 වන ව්‍යවස්ථා සංශෝධනය/ 19 වන සංශෝධනය/ 19

17 වන ව්‍යවස්ථා සංශෝධනය/ 17 වන සංශෝධනය/ 17

**11.** පහත සඳහන් ප්‍රකාශ දෙකෙහි සඳහන් වන්නේ දේශපාලන ආයතන දෙකක් පිළිබඳව ය. ඒවා නම් කරන්න.

(1) මැතිවරණ තුළින් දේශපාලන බලය ලබාගැනීම අරමුණු කරගත් සංවිධාන
දේශපාලන පක්ෂ/පක්ෂ

(2) මහජන උද්ඝෝෂණවලින් ස්වකීය අරමුණු ලබාගැනීමට උත්සාහ කරන සංවිධාන

බලපෑම් කණ්ඩායම්/ සිවිල් සමාජ ව්‍යාපාර/ සමාජ ව්‍යාපාර/ සිවිල් සමාජය/ වෘත්තීය සමිති



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**12.** (1) ඇමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ නිල නාමය කුමක් ද?

කොංග්‍රස් මණ්ඩලය/ කොංග්‍රස් සභාව/ කොංග්‍රසය

(2) ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ ඉහළ මන්ත්‍රී මණ්ඩලයේ නිල නාමය කුමක් ද?

රාජ්‍ය සභාව

**13.** (1) යටත්විජිත ශ්‍රී ලංකාවේ සීමිත ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

1910 මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය/ 1910/ මැකලම්/ කෲව්-මැකලම්

(2) යටත්විජිත ශ්‍රී ලංකාවේ විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය/ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ 1931/ඩොනමෝර්

**14.** ෆැසිස්ට් මතවාදය වෙනුවෙන් පෙනී සිටි යුරෝපා රාජ්‍ය නායකයින් **දෙදෙනෙකු** නම් කරන්න.

බෙනිටෝ මුසෝලිනි/ මුසෝලිනි

ආඩොල්ෆ් හිට්ලර් / හිට්ලර්

ස්පාඤ්ඤයේ ෆ්‍රැන්කෝ/ ෆ්‍රැන්කෝ /ජෙනරල් ෆ්‍රැන්කෝ/ ප්‍රැන්සිස්කෝ ෆ්‍රැන්කෝ

**15.** පළාත් සභා ස්ථාපිත කිරීමේදී 1978 ව්‍යවස්ථාවට සිදු කළ 13 වන සංශෝධනය මගින් විෂය ලැයිස්තු තුනක් හඳුන්වා දී තිබේ. ඉන් ඕනෑම **දෙකක්** නම් කරන්න.

පළාත් සභා ලැයිස්තුව/ පළාත් ලැයිස්තුව/ පළාත්/ පළමු වැනි ලැයිස්තුව

මධ්‍යම ලැයිස්තුව/ මධ්‍යම ආණ්ඩු ලැයිස්තුව/ මධ්‍යම/ සංවෘත ලැයිස්තුව/ සංවෘත/ දෙවැනි ලැයිස්තුව

සමගාමී ලැයිස්තුව/ තුන්වැනි ලැයිස්තුව

www.alevelapi.com

**16.** ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

මධ්‍යම ආණ්ඩුව උත්තරීතර වීම.

එක් මධ්‍යම ආණ්ඩුවක් පමණක් පැවතීම.

එක් පුරවැසිභාවයක් තිබීම/ ඒකීය පුරවැසිභාවය

ප්‍රාදේශිය ව්‍යවස්ථාදායක නොතිබීම./ මධ්‍යම ව්‍යවස්ථාදායකයට සමාන්තර ව්‍යවස්ථාදායක නොතිබීම.

ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල මධ්‍යම ආණ්ඩුව වෙත කේන්ද්‍රගත වීම.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**17.** දේශපාලනය අධ්‍යයනය කිරීමේ නූතන ප්‍රවේශ **දෙකක්** නම් කරන්න.

චර්යාවාදී ප්‍රවේශය/ චර්යාවාදය/ විද්‍යාත්මක ප්‍රවේශය/ විද්‍යාත්මක

සමාජ විද්‍යාත්මක ප්‍රවේශය/ සමාජ විද්‍යාත්මක

පද්ධති විශ්ලේෂණ ක්‍රමය

සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමය

බහු විෂයිත ප්‍රවේශය

ස්ත්‍රීවාදී ප්‍රවේශය/ පශ්චාත් නූතන ප්‍රවේශය

සමකාලීන තුලනාත්මක ප්‍රවේශය

අර්ථශාස්ත්‍ර ප්‍රවේශය

**18.** (1) ලෝක සාමය සහ ආරක්ෂාව පිළිබඳව වගකීම් දරණ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතනය කුමක් ද?

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය

(2) මානව අයිතිවාසිකම් සම්බන්ධව කටයුතු කරන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනය නම් කරන්න.

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සිලය/ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය

UNHRC එක

**19.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල සිවිල් සමාජය සතු කාර්යයන් **දෙකක්** නම් කරන්න.

උපදේශනය/ ප්‍රතිපත්ති උපදේශනය/ දේශපාලන මග පෙන්වීම.

පුරවැසි සවිබල ගැන්වීම.

විකල්ප ප්‍රතිපත්ති යෝජනා කිරීම.

ආණ්ඩුවේ බලය සංවරණය වීම.

විරෝධතා බලයක් ලෙස ක්‍රියා කිරීම.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මුර බල්ලෙකු ලෙස ක්‍රියා කිරීම.

පුරවැසියන් සාමූහික සමාජ ජීවිතයකට හුරුකරවීම.

පුරවැසියන් ස්වාධීනව සංවිධානය කිරීම.

දේශපාලන අධ්‍යාපනය.

**20.** (1) ශ්‍රී ලංකාවේ බිහි වූ ප්‍රථම වාමාංශික දේශපාලන පක්ෂය නම් කරන්න.

ලංකා සම සමාජ පක්ෂය/ ලසසප/ LSSP

(2) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ලංකාවට හඳුන්වා දෙන ලද විදේශ ප්‍රතිපත්ති මතවාදය නම් කරන්න.

නොබැඳි පිළිවෙත/ නොබැඳි ප්‍රතිපත්තිය



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

**උපදෙස්:**

* **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

**1.** දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 20)

**2.** රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යාය **හෝ** මාක්ස්වාදී න්‍යාය **හෝ** සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**3.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** විභාග කරන්න.
(i) රාජ්‍යය සහ අන්‍ය සමාගම්
(ii) රාජ්‍යය සහ ආණ්ඩුව
(iii) රාජ්‍යය සහ ජාතිය
(iv) ආණ්ඩුබලය සංවරණය කිරීමේ මාධ්‍ය (ලකුණු 10 × 2 = 20)

**4.** පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳව සාකච්ඡා කරන්න.
(i) කැබිනට් ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
(ii) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
(iii) මිශ්‍ර ආණ්ඩුක්‍රමයක විධායකය
(iv) ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ (ලකුණු 10 × 2 = 20)

## C කොටස

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** සාකච්ඡා කරන්න.
(i) ලංකා ජාතික සංගමය හා ජාතික ව්‍යාපාරය
(ii) ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය හා වර්ධනය
(iii) යටත්විජිත සමයේ ලංකාවේ ආගමික පුනර්ජීවන ව්‍යාපාර
(iv) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යුගයේ සුළුතර ප්‍රජාවන්ගේ දේශපාලනය (ලකුණු 10 × 2 = 20)

**6.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව පවතින විවේචන කවරේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 20)

**7.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** විභාග කරන්න.
(i) 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ බලතල සහ කාර්යභාරය
(ii) 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ බලතල සහ කාර්යභාරය
(iii) 1972 ව්‍යවස්ථාව යටතේ අධිකරණය
(iv) 1978 ව්‍යවස්ථාව යටතේ අධිකරණය (ලකුණු 10 × 2 = 20)

**8.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(i) සාක් සංවිධානය සහ කලාපීය සහයෝගීතාව
(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක සාමය
(iii) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩගස්වන සාධක
(iv) ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ලෝක දේශපාලනය තුළ ඉටු කරන භූමිකාව (ලකුණු 10 × 2 = 20)

* * *



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**1.** දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

**අරමුණ**

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන්නේ දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීමේ වැදගත්කම හා අධ්‍යයනයෙන් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කිරීමට අපේක්ෂකයන් සතු විෂය දැනුම සහ විග්‍රහාත්මක හැකියාව ඇගයීමට භාජනය කිරීමයි.

**පිළිතුරේ අන්තර්ගතය**

**හැඳින්වීම (ලකුණු 03)**

දේශපාලනය යනු කුමක්දැයි අර්ථකථනය කොට, එය මානව ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවත්, දේශපාලනය සැමතැන විහිද පවතින බවත්, දේශපාලනික බලපෑමෙන් වියුක්තව කිසිවෙකුට ජීවත්විය නොහැකි බවත් පෙන්වා දෙමින් මෙම පිළිතුර ආරම්භ කළ හැකිය.

දේශපාලන විද්‍යාව යනු දේශපාලනය නැමැති සංසිද්ධිය විද්‍යාත්මකව සහ ශාස්ත්‍රීයව අධ්‍යනය කිරීමයි.

**සාකච්ඡාව (ලකුණු 14)**

- දේශපාලනය හා දේශපාලන අධ්‍යයනය අතර වෙනස පැහැදිලි කිරීම.
- දේශපාලනය අත්‍යවශ්‍යයෙන්ම මානව ජීවිතය හා ගැටගැසී ඇති නිසා දේශපාලනය ශාස්ත්‍රීය වශයෙන් හැදෑරීම අත්‍යවශ්‍ය බව ප්‍රකාශ කර තිබීම.
- තමා ජීවත් වන දේශපාලන ක්‍රමය තුල දේශපාලන ව්‍යූහ, දේශපාලන ආයතන, දේශපාලන සංසිද්ධි, අවබෝධ කර ගැනීමට හා විශ්ලේෂණය කිරීමට ඇති හැකියාව .
- දේශපාලනය ශාස්ත්‍රීය වශයෙන් හැදෑරීම නිසා විද්‍යාර්ථියා සමාජ හිතෛෂී පුද්ගලයෙකු වන බව පැහැදිලි කිරීම.
- දේශපාලන මතවාද, දේශපාලන දර්ශන, දේශපාලන දෘෂ්ටිවාද හැදෑරීම තුළින් තාර්කිකත්වය හා බුද්ධිය මුහුකුරා යෑම.
- දේශපාලන විචාරයේ සහ විශ්ලේෂණයේ හැකියාව ලබා ගැනීම.
- දේශපාලන මූලධර්ම, දේශපාලන සාරධර්ම යනාදිය අවබෝධ කර ගැනීම මගින් පුරවැසි යහගුණය වර්ධනය වීම.
- දේශපාලන ක්‍රමයට සමාජානුයෝජනය වීමට සහ හැඩගැසීමට අවශ්‍ය අවබෝධය සහ මගපෙන්වීම ලැබීම.
- රාජ්‍ය තාන්ත්‍රිකයින් බිහිකර ගැනීමට අවශ්‍ය දේශපාලනය පිළිබඳ දැනුම ඇති උගත් පුරවැසියන් බිහි කළ හැකි වීම.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- දේශපාලනයේ සෑම පැතිකඩක්ම හැදෑරීමට ඉඩ ලැබෙන නිසා එය, වෘත්තීය දේශපාලනඥයින් සහ පරිපාලකයින් වීමට අපේක්ෂා කරන අයට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලැබේ.

  **ඉහත සඳහන් කරුණුවලට වැඩි විග්‍රහයක් අපේක්ෂකයා විසින් සඳහන් කොට තිබේ නම් වැඩි ලකුණු ලබා දීම මැනවි.**

  **(සාකච්ඡාවට ප්‍රදානය කල යුතු ලකුණු 14)**

**නිගමනය (ලකුණු 03)**

දේශපාලනය හැදෑරීම ලෝකයේ ඇති පැරණිතම ශාස්ත්‍රීය ශාඛාවකි. එය දියුණු දේශපාලන චින්තකයින් සහ රාජ්‍ය තාන්ත්‍රිකයින් සිටි පුරාතන ඉන්දියාවේ, චීනයේ සහ ග්‍රීසියේ ආරම්භ විය. එම දේශපාලන අධ්‍යයන ශත වර්ෂ 30කට වඩා කාලයක් අඛණ්ඩව පැවත තිබීමෙන් පෙනෙන්නේ, එහි ඇති බුද්ධිමය සහ ප්‍රායෝගික වැදගත්කමයි.

**(මුළු ලකුණු 20කි)**

සැ.යු:- දේශපාලන විද්‍යාව හැදෑරීමේ දී අපේක්ෂකයන් අත් විඳි පුද්ගලික අත්දැකීම් ද න්‍යායික දැනුම ද මේ පිළිතුර ගොඩනැගීමේ දී තාර්කික හා හරවත් ලෙස යොදාගෙන තිබේ නම්, ලකුණු දීමේදී ඒ සඳහා විශේෂ සැලකිල්ලක් දක්වන්න.

**2.** රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යාය **හෝ** මාක්ස්වාදී න්‍යාය **හෝ** සාකච්ඡා කරන්න.

**අරමුණ**

මේ ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ, දේශපාලන විද්‍යාවේත්, ප්‍රායෝගික දේශපාලනයේත් මූලිකතම සංකල්පයක් වන රාජ්‍යය පිළිබඳව අපේක්ෂකයන් සතු න්‍යායික අවබෝධය ඇගයීමට පාත්‍ර කිරීමයි. අපේක්ෂකයින් තෝරා ගත යුත්තේ ප්‍රශ්නයෙන් දි ඇති න්‍යාය දෙකෙන් එකක් පමණි.

**2.1 රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යාය**

**හැඳින්වීම.(ලකුණු 03)**

- රාජ්‍යයේ සම්භවය, නූතන ලෝකයේ රාජ්‍යයේ ස්වභාවය සහ කාර්යයන් පිළිබඳවත්, රාජ්‍යය යනු කුමක්දැයි වටහා ගැනීම සම්බන්ධවත් පවතින කේන්ද්‍රීය න්‍යායක් වන්නේ ලිබරල්වාදය බව ප්‍රකාශ කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය. එමෙන්ම රාජ්‍යය පිළිබඳව ලිබරල්වාදී එක් නිශ්චිත න්‍යායක් නැති බවත්, ලිබරල් න්‍යායික සහ දාර්ශනික සම්ප්‍රදාය තුළ රාජ්‍යය පිළිබඳ ප්‍රවේශ කිහිපයක් ඇති බවත් මෙහිදී කිව හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 14)**

- රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදි න්‍යාය ආරම්භ වුයේ 17 වැනි සියවසේ ය. එය යුරෝපයේ වැඩවසම් සමාජ - ආර්ථික ක්‍රමය සහ රාජාණ්ඩුක්‍රමය බිඳවැටීමේත්, ධනවාදී ආර්ථික හා සමාජ ක්‍රමය බිහිවීමේත් ඓතිහාසික සන්දර්භය තුළ බිහි වූ දේශපාලන න්‍යායකි.
- රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යායේ ආරම්භක දේශපාලන චින්තකයින් වූයේ ජෝන් ලොක්, රූසෝ, එම්මානුවේල් කාන්ට්, ජෝන් ස්ටුවර්ට් මිල්, ජෙරමි බෙන්තම් හා මොන්ටෙස්කියු යන යුරෝපීය දාර්ශනිකයන්ය.
- රාජ්‍යය පිළිබඳ සම්භව්‍ය ලිබරල්වදී න්‍යාය ජෝන් ලොක්, ජෝන් ස්ටුවර්ට් මිල්, මොන්ටෙස්කියු සහ කාන්ට් යන දාර්ශනිකයන්ගේ ඉගැන්වීම්වලින් පෝෂණය වී ඇත.
- සමාජ සම්මුතිවාදය රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී ප්‍රවේශය ගොඩනැගුණු මූලික ප්‍රවාදයයි. ජෝන් ලොක් හා රූසෝ මෙන්ම කාන්ට් ද මෙම ප්‍රවේශය යොදා ගත්හ.
- ඉහත චින්තනකයින් ගොඩනැගූ සම්භව්‍ය ලිබරල්වාදී න්‍යායට අනුව ලිබරල් රාජ්‍යය පිළිබඳ න්‍යායේ ප්‍රධාන අංග මෙසේය.
    i. රාජ්‍යය සමාජයේ නිර්මාණයකි. රාජ්‍යය බිහිකළේ දෙවියන් හෝ සමාජයට බාහිර බලවේගයක් විසින් නොව, මනුෂ්‍යයන් විසින්ම තම ජීවිතය, නිදහස හා දේපළ ආරක්ෂාව සහතික කර ගැනීමටය.
    ii. රාජ්‍යය මනුෂ්‍යයින් නිර්මාණය කර ඇත්තේ ඔවුන් හා පාලකයන් අතර ඇතිවන ගිවිසුමක ප්‍රතිඵලයක් හැටියට ය. එම ගිවිසුම මගින් පාලකයින්ට බලය පවරන්නේ මහජනතාව ස්වෙච්ඡාවෙනි. පරමාධිපත්‍ය බලය ඇත්තේ එම මහජනතාවට මිස පාලකයාට නොවේ.
    iii. රාජ්‍යයේ මූලික වගකීම පුද්ගල නිදහස සහතික කිරීමයි. පුරවැසි නිදහස උල්ලංඝණය කිරීම රාජ්‍යය සහ සමාජය අතර ඇති සමාජ ගිවිසුම උල්ලංඝනය කිරීමකි.
    iv. රාජ්‍යය ආර්ථික ක්ෂේත්‍රයට මැදිහත් නොවිය යුතුය. නිදහස් වෙළඳපොල මාර්ගයෙන් ආර්ථික ක්ෂේත්‍රය රාජ්‍යයේ පාලනයෙන් සහ මැදිහත්වීමෙන් නිදහස් කිරීම ලිබරල් රාජ්‍යයේ ප්‍රධාන වගකීමකි. 'රාජ්‍ය නිර්බාධවාදය' යනුවෙන් හැඳින්වූයේ මෙම ප්‍රවේශයයි.
    v. රාජ්‍යයේ බලය හෝ දේශපාලන බලය ප්‍රජාපීඩක ලෙස භාවිතා නොකළ යුතුය. මේ සඳහා පැවතිය යුත්තේ 'සීමිත බලතල සහිත' ව්‍යවස්ථාදායකයක් සහ විධායකයක් සහිත ආණ්ඩුවකි. මෙය ජෝන් ලොක් ඉදිරිපත් කළ සංකල්පයකි.



Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- රාජ්‍යය පිළිබඳ මෙම සම්භව්‍ය ලිබරල්වාදී මතය 19 වැනි සියවසේ මැදභාගයේ සිට වෙනස්වීම්වලට භාජනය විය. ජෙරමි බෙන්තම්ගේ උපයෝගිතාවාදයෙන් යෝජනා වූයේ වැඩිදෙනාගේ වැඩිම යහපත සහතික කිරීමට ආණ්ඩුව නීතිමය සහ රාජ්‍ය ප්‍රතිපත්ති මාධ්‍යයෙන් මැදිහත් විය යුතු බවයි.
- ඊට පසුව දහනව වැනි සියවසේ අග දශකය වන විට ටී. එච්. ග්‍රීන් නම් ලිබරල් චින්තකයා රාජ්‍යය පිළිබඳ නිර්බාධවාදී ලිබරල් න්‍යාය සංශෝධනය කළේය. ඒ අනුව සමාජ - ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා රාජ්‍යය මැදිහත් විය යුතුය. මෙම ප්‍රවේශය එකල හැඳින්වූයේ රාජ්‍යය පිළිබඳ අලුත් ලිබරල්වාදය (New liberalism) ලෙසය.
- විසිවැනි සියවසේ මුල් භාගයේ දී සමාජ සුභසාධනවාදී කාර්යයන් ද රාජ්‍යයේ වගකීම් අතරට එකතු කරනු ලැබුණි.
- 1980 ගණන්වල සිට රාජ්‍යය පිළිබඳ නව ලිබරල් (Neo - liberal) න්‍යාය වර්ධනය වී තිබේ. එයින් ඇත්තටම අදහස් වූයේ රාජ්‍යය පිළිබඳ සම්භාව්‍ය නිර්බාධවාදී ප්‍රවේශය දේශපාලන න්‍යායට නැවත ගෙන ඒමයි. මෙයට වැදගත් වන දේශපාලන චින්තකයන් නම් ෆෙඩ්රික් හයෙක්, රොබර්ට් නොසික් සහ මිල්ටන් ෆ්‍රීඩ්මන්ය.
- නූතන ලෝකයේ සිදුවන නිදහස් වෙළඳපොල ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ඒ මත සිදුවන රාජ්‍ය ප්‍රතිසංස්කරණවලට මතවාදීමය වශයෙන් මග පෙන්වන්නේ රාජ්‍යය පිළිබඳ මෙම නව ලිබරල්වාදී න්‍යායයි. රාජ්‍යය පිළිබඳ වර්තමාන නව ලිබරල්වාදී ප්‍රතිසංස්කරණ වල මූලික අංග මෙසේය.
    1. වෙළඳපොළ රාජ්‍යයේ පාලනයෙන් සහ මැදිහත්වීමෙන් නිදහස් විය යුතු අතර, එය සහතික කිරීම නව ලිබරල් රාජ්‍යයේ ප්‍රධාන කර්තව්‍යයකි.
    2. රාජ්‍යය සමාජ සුභසාධනය සහ ආදායම් ප්‍රතිව්‍යාප්තිය සඳහා ඍජුව මැදිහත් නොවිය යුතුය. එම කාර්යයන් වෙළඳපොල ක්‍රියාකාරීත්වයට පැවරිය යුතුය.
    3. ආර්ථිකයේ රාජ්‍ය අංශය අහෝසි හෝ කුඩා කළ යුතුය. ඒ නිසාම රාජ්‍යයේ ආයතනික විශාලත්වය ද කුඩා කළ යුතුය. ඒ මගින් රාජ්‍යය කාර්යක්ෂම කළ හැකි යැයිද, රාජ්‍යයට පුද්ගලික වෙළඳපොල සමග තරග කළ හැකි යැයි ද නව - ලිබරල්වාදීහු තර්ක කරති.

**නිගමනය (ලකුණු 03)**

ඉහත සාකච්ඡාවෙන් පෙනෙන මූලික අදහස සාරාංශ කර ඉදිරිපත් කිරීමෙන් නිගමනය කොටස ආරම්භ කළ හැකියි. එහිදී අවධාරණය කළ යුතු කරුණු කිහිපයක් මෙසේය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යාය අවුරුදු 200කට වඩා කාලයක් තිස්සේ විකාශනයට භාජනය වූවකි.
- නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ දේශපාලන ආයතන හැඩ ගැන්වීමට එය විශාල දායකත්වයක් කර ඇත.
- නූතන ලෝකයේ රාජ්‍යය පිළිබඳ නව ලිබරල්වාදී ප්‍රවේශය මහත් විවේචනවලට භාජනය වී තිබේ.

## 2.2 රාජ්‍ය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය

**අරමුණ**

මෙම මාතෘකාවෙන් අපේක්ෂා කරන්නේ රාජ්‍යය පිළිබඳ දේශපාලන න්‍යායේ ප්‍රධාන ප්‍රවේශයක් වන මාක්ස්වාදී න්‍යාය රාජ්‍යය විග්‍රහකරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුමක් අපේක්ෂකයන් හිමිකරගෙන තිබේ දැයි පරීක්ෂා කිරීමයි.

**හැඳින්වීම (ලකුණු 03)**

රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය, රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යායට තරගකාරී එකක් බවත්, සමාජවාදී රාජ්‍ය මාදිලිය මාක්ස්වාදී න්‍යාය මත පදනම් වී ඇති බවත් ප්‍රකාශ කරමින්, හැඳින්වීම ඡේදයකින් පිළිතුරට ආරම්භයක් සපයා ගත හැකිය.

**සාකච්ඡාව (ලකුණු 14)**

- රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය, කාල් මාක්ස්, ෆෙඩ්රික් එන්ගල්ස් සහ වී. අයි. ලෙනින් යන චින්තකයින් තිදෙනාගේ ඉගැන්වීම් සහ ලේඛන මත පදනම් වී ඇති බව කිව යුතුය. එය 19 වන සියවස වන විට යුරෝපීය දේශපාලන දර්ශනවාදයේ රාජ්‍යය පිළිබඳ අධිපති ප්‍රවේශය වූ ලිබරල්වාදය විවේචනය කරමින් එයට විකල්ප වශයෙන් ගොඩනගන ලද න්‍යායක් ද වේ.
- රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය ගොඩ නගා ඇත්තේ ඓතිහාසික භෞතිකවාදය නම් වූ විධික්‍රමික ප්‍රවේශයකිනි. එම ප්‍රවේශයෙන් අවධාරණය වූයේ රාජ්‍යය මනුෂ්‍ය සමාජය තුළ බිහිවූයේත්, පවතින්නේත් එක් එක් සමාජය තුළ පවත්නා භෞතික, එනම් ද්‍රව්‍යමය, පදනම් මතය යන්නයි. භෞතික නැතහොත් ද්‍රව්‍යමය පදනම් යනු ආර්ථික පදනම් සහ ඒ මත ගොඩනැගෙන සමාජ පන්තීන් ය. රාජ්‍යය සමාජයට ඉහළින් සහ පිටතින් පවත්නා අදෘශ්‍යමාන සහ උත්තරීතර බලවේගයක්ය යන හේගල්ගේ විග්‍රහය ප්‍රතික්ෂේප කරමින්, එය මනුෂ්‍ය සමාජය තුළම බිහි වූ සමාජමය ආයතනයක්ය යන විග්‍රහය ඒ මගින් මාක්ස් සහ එංගල්ස් අවධාරණය කළහ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- රාජ්‍යය ඓතිහාසික වශයෙන් විකාශනය වූ සමාජ ආයතනයක්ය යන්න ද මාක්ස්වාදී න්‍යායයේ ඇති ප්‍රධාන උපකල්පනයකි. මේ අනුව රාජ්‍යය බිහි වී, විකාශනය වීමේ දී එක් එක් ඓතිහාසික යුගයට නිශ්චිත ඓතිහාසික ස්වරූප අත්පත් කරගෙන ඇත. ගෝත්‍රික, වහල්, වැඩවසම්, ධනවාදී යන වශයෙන් රාජ්‍යය ප්‍රධාන ඓතිහාසික ස්වරූප ගෙන ඇතැයිද, රාජ්‍යය අහෝසි වන ඓතිහාසික යුගයක් අනාගතයේ ගොඩනැගෙනු ඇතැයි ද මාක්ස්වාදී න්‍යාය කියා සිටියි.
- රාජ්‍යයේ ආරම්භය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය ද, පූර්ව රාජ්‍ය අවධියක්, එනම් රාජ්‍යය නොමැති වූ අවධියක්, ගැන සඳහන් කරයි. රාජ්‍යය නොමැති වූ අවධිය ප්‍රාථමික කොමියුනිස්ට් සමාජය බව එයින් ප්‍රකාශ වේ. ප්‍රාග් කොමියුනිස්ට් සමාජයේ ලක්ෂණය නම්, පුද්ගලික දේපල ක්‍රමයක් නොපැවතීම සහ දේපලවල පොදු අයිතියක් පැවතීමයි. එවැනි පසුබිමක රාජ්‍යයක් අවශ්‍ය නොවූ බව මාක්ස්වාදී න්‍යාය කියා සිටියි.
- මාක්ස්වාදී න්‍යාය අවධාරණය කරන ප්‍රධාන තර්කයක් නම්, මනුෂ්‍ය ඉතිහාසයේ පළමු වරට රාජ්‍යය බිහිවූයේ, ආර්ථික අසමානතා පදනම් කොටගත් පංති ක්‍රමයක් බිහිවීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජය එකිනෙකාට පසමිතුරු පංතිවලට බෙදීමේ ප්‍රතිඵලයක් ලෙසය යන්නයි. මේ අනුව, රාජ්‍යය පංති විභේදනයේ නිර්මාණයකි. එය ආර්ථික බලය හිමි අධිපති සමාජ පන්තියේ ආධිපත්‍යයේ උපකරණය බවද මාක්ස්වාදී න්‍යාය කියා සිටියි.
- මේ අනුව රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය ඉදිරිපත් කර ඇත්තේ ''පංති විග්‍රහයකි'' නැතහොත් ''පංති න්‍යායකි''. ඒ අනුව රාජ්‍යය යනු සමාජයේ සෑම කෙනෙකුම සතු දේශපාලන ආයතනයක් නොවේ. එය ආර්ථික වශයෙන් අධිපති සහ පාලක පන්තිය සතු පන්ති ආධිපත්‍යයේ උපකරණයකි. එය වහල් සමාජයේදී වහල් හිමි පන්තීන්ගේද, වැඩවසම්වාදයේ ඉඩම් හිමි රදළ පන්තීන්ගේද, ධනවාදී සමාජයේ ධනපති පන්තියේ ද පන්ති ආයුධයක් බව මාක්ස්වාදී න්‍යාය තවදුරටත් ප්‍රකාශ කරයි.
- මේ වෙතින්, රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායයේ තවත් අංගයක් ප්‍රකාශයට පත් වේ. එය නම්, රාජ්‍යය යනු අවශ්‍යයෙන්ම ප්‍රචණ්ඩ සහ මර්දනකාරී ආයතනයක්ය යන්නයි. ඒ අනුව අධිපති පාලක පන්තීන්, පීඩිත පන්තීන් සූරා කෑමට, පීඩිතභාවයේ තබා ගැනීමට සහ ඔවුන්ගේ විරෝධතා මැඩපැවැත්වීමට යොදා ගන්නා ප්‍රධානතම ආයතනික උපකරණය රාජ්‍යයයි.
- රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායයේ ඇති පංති විග්‍රහයෙන් ප්‍රකාශ වන්නේ, රාජ්‍යය බිහිවූයේ පංති බෙදීම සහ පංති ගැටුම සමාජයේ බිහිවීමේ ප්‍රතිඵලයක් ලෙස නම්, පංති බෙදීම නොමැති තත්වයක් තුළ, රාජ්‍යය පැවතීමේ අවශ්‍යතාවද, තර්කණයද අහෝසි වේ. කොමියුනිස්ට් සමාජය යනු පංති නොමැති වීම නිසා රාජ්‍ය - රහිත තත්ත්වයක් පවත්නා සමාජය බව ද මාක්ස්වාදී න්‍යය අනාවැකි පළ කළේ ය. පංති විරහිත කොමියුනිස්ට් සමාජය කරා මනුෂ්‍ය සමාජය පා තබන විට ''රාජ්‍යය වියැකී යන්නේ ය'' යනු මාක්ස්වාදී න්‍යායයේ මේ සම්බන්ධව ඇති ප්‍රකාශනයයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- මාක්ස්වාදී න්‍යාය රාජ්‍යය වියැකී යාම පිළිබඳ කර ඇති ඓතිහාසික පුරෝකථනය බොහෝ විවේචනයට ලක් වී ඇත. එය හුදු කාල්පනික පුරෝකථනයක් මිස යථාර්ථයක් නොවන්නේ ය යන්න විවේචකයින්ගේ අදහසයි.
- මාක්ස්වාදී න්‍යායේ ඇති රාජ්‍යය පිළිබඳ පංති විග්‍රහය ද ලිබරල්වාදී දේශපාලන න්‍යායවේදීන්ගේ විවේචනයට ලක් වී තිබේ. ඔවුන්ගේ තර්කය නම්, රාජ්‍යය එක පන්තියක පමණක් ආයුධයක් වන්නේය යන අදහස ආනුභූතික වශයෙන් වැරදි ප්‍රවාදයක්ය යන්නයි. මෙම ලිබරල්වාදී විවේචනය එන ලිබරල් න්‍යායික ප්‍රවේශය හඳුන්වන්නේ රාජ්‍යය පිළිබඳ ''බහුත්වවාදී න්‍යාය'' ලෙස ය. ඒ අනුව රාජ්‍යය යනු එක පන්තියක ඒකාධිකාරයට හසුවන දේශපාලන ආයතනයක් නොවේ. එය විවිධ සමාජ කණ්ඩායම්වල ඉල්ලීම් සහ අභිලාෂවලටද ප්‍රතිචාර දක්වන්නකි.

**නිගමනය (ලකුණු 03)**

දේශපාලන න්‍යායේ විවාදයට පාත්‍ර වී තිබුණත්, මාක්ස්වාදී න්‍යාය, රාජ්‍යය සමාජයේ ඉටුකරන කාර්යය සහ රාජ්‍යයේ ස්වභාවය ගැන බලසම්පන්න විග්‍රහයක් සහ විවේචනයක් ඉදිරිපත් කරන බව කියමින්, පිළිතුර අවසන් කළ හැකිය. මාක්ස්වාදී න්‍යායේ ඇති වැදගත්ම තර්කයක් නම් රාජ්‍යය යනු සමාජයේ ඇති ආර්ථික, සමාජ සහ දේශපාලන බලය අසමාන ලෙස බෙදී යාම පිළිඹිබු කරන ප්‍රධානතම සමාජ ආයතනය වන්නේය යන්නයි.

**3.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** විභාග කරන්න.

(i) රාජ්‍යය සහ අන්‍ය සමාගම්
(ii) රාජ්‍යය සහ ආණ්ඩුව
(iii) රාජ්‍යය සහ ජාතිය
(iv) ආණ්ඩුබලය සංවරණය කිරීමේ මාධ්‍ය

**අරමුණ**

www.alevelapi.com

මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ දේශපාලන විද්‍යා න්‍යායේත්, විග්‍රහයේත්, ප්‍රායෝගික දේශපාලන ලෝකයේත් වැදගත් වන තේමා හතරක් ආශ්‍රිතව අපේක්ෂකයන් සතු විෂය දැනුම සහ විග්‍රහාත්මක හැකියාවන් පරික්ෂා කිරීමයි. අපේක්ෂකයින් මාතෘකා දෙකක් තෝරා ගත යුතුය.

**3. i රාජ්‍යය සහ අනෙකුත් සමාගම්**

**අරමුණු**

මෙම මාතෘකාවේ අරමුණ රාජ්‍යය අනෙකුත් මනුෂ්‍ය සමාගම්වලින් වෙන්කොට හඳුනා ගැනීමටත්, රාජ්‍යය සියලු මනුෂ්‍ය සංවිධාන අතුරින් සුවිශේෂ මනුෂ්‍ය සංවිධානයක් වන්නේ මන්ද යන්න පැහැදිලි කිරීමටත් ඇති විෂය දැනුම සහ හැකියාව පරික්ෂා කිරීමයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## පිළිතුරේ අන්තර්ගතය

### හැඳින්වීම (ලකුණු 02)

- රාජ්‍යය මනුෂ්‍ය සංවිධානයකි. මෙම මාතෘකාව සාකච්ඡා කිරීමේදී රාජ්‍යය සමාගමක් වන්නේය යන ඇරිස්ටෝටල්ගේ ප්‍රකාශය සමග ද සම්බන්ධ කරමින් සාකච්ඡාව ආරම්භ කළ හැකිය. මානව සමාගමක් ලෙස රාජ්‍යයට ද සාමාජිකයෝ සිටිති. ඔවුහු ''පුරවැසියන්'' ලෙස හැඳින්වෙති. මෙවැනි කෙටි සාකච්ඡාවකින් ''හැඳින්වීම'' සමන්විත විය යුතුය.

### සාකච්ඡාව (ලකුණු 06)

- රාජ්‍යය මනුෂ්‍ය සමාගමක් වන නමුදු, එය සමාජයේ ඇති අනෙක් සමාජවලින් වෙනස් ය.
- රාජ්‍යය මනුෂ්‍ය සමාගමක් ලෙස අන්‍ය මනුෂ්‍ය සමාගම්වලින් වෙනස්වන ආකාරය මෙම පිළිතුරෙන් පැහැදිළි කළ යුතු වේ.

**අනෙකුත් සමාගම්**

i. සාමාජිකත්වය ලැබෙන්නේ ස්වෙච්ඡාවෙනි.
ii. ඒවායේ කාර්යයන් සීමිතය.
iii. තම සාමාජිකයන් මත තම අධිෂ්ඨානය බලහත්කාරයෙන් පැටවීමට ඒවාට නොහැකිය. එහෙත් රාජ්‍යයට පුළුවන.
iv. සාමාන්‍යයෙන් ඒවායේ ජීවිත කාලය සීමිතය.
v. ඒවා උනන්දුවන්නේ සමාජයේ ඉතාම සීමාසහිත පිරිස්වල අභිලාෂ සහ සුභසාධනය සඳහා ය.

www.alevelapi.com

**රාජ්‍යය**

i. සාමාජිකත්වය අනිවාර්යය. ස්වෙච්ඡාවෙන් රාජ්‍යයේ සාමාජිකත්වය ලබාගැනීමේ අවස්ථා අල්පය, රාජ්‍යයේ සාමාජිකත්වය නොමැතිව, පුද්ගලයෙකුට සමාජ ලෝකයේ පැවතිය නොහැක.
ii. රාජ්‍යයේ සාමාජිකත්වය හැඳින්වෙන්නේ ''පුරවැසිභාවය'' නමිනි. තම සාමාජිකත්වය ලැබූ සාමාජිකයින්ට රාජ්‍යය අයිතිවාසිකම්, වරප්‍රසාද සහ යුතුකම් මාලාවක් ද ප්‍රදානය කරයි. ඒවා බොහෝ විට ජාත්‍යන්තර වශයෙන් ද පිළිගන්නා ඒවාය.
iii. රාජ්‍යයට පරමාධිපත්‍යය හිමි ය. එබැවින් රාජ්‍යය එහි සාමාජිකයන් වන මුළු ජනතාවගේම පරමාධිපත්‍යය නියෝජනය කරතැයි ද කියා සිටියි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

iv. රාජ්‍යයට තම කැමැත්ත සහ අධිෂ්ඨානය මුළු සමාජය මතම බලය යොදවා පැවැත්වීමේ අධිකාර බලය සහ මාධ්‍ය තිබේ.
v. තම සාමාජිකයන් මෙන්ම සමාජයේ පවතින අනෙක් ආයතන සම්බන්ධයෙන් ද බලහත්කාරී බලයේ ඒකාධිකාරය තමන්ට ඇතැයි රාජ්‍යය කියා සිටියි.
vi. රාජ්‍යයට එහි දේශසීමාව ඇතුළත තිබෙන අන් සියලු සමාගම් අභිබවා යන උත්තරීතර අධිකාර බලයක් තිබේ. එම සංවිධාන තම අධිකාර බලයට අවනත වෙතැයි රාජ්‍යය අපේක්ෂා කරයි.

- ඇරිස්ටෝටල් කියා ඇති පරිදි සමාජයේ අනෙක් සමාගම් උනන්දුවන්නේ සීමිත ප්‍රමාණයක වැසියන්ගේ සුභසාධනය සහ යහපත ගැනය. එහෙත් රාජ්‍යය උනන්දුවන්නේ විශාල ජනගහනයක යහපත සහ සුභසාධනයටය.

**නිගමනය (ලකුණු 02)**

- ඉහත සාකච්ඡාවේ ප්‍රධාන කරුණු සාරාංශ කරමින්, රාජ්‍යය මනුෂ්‍ය සංවිධානයක් වුවත් එයට සුවිශේෂී ගති ලක්ෂණ ඇති බවත්, ඒ නිසාම එය අනෙක් සමාගම්වලින් වෙනස් වන බවත් ප්‍රකාශ කරමින්, පිළිතුර අවසන් කළ හැකි ය.

**3. ii රාජ්‍යය සහ ආණ්ඩුව**

**අරමුණ**

දේශපාලන න්‍යාය සහ අධ්‍යයනය තුළ රාජ්‍යය සහ ආණ්ඩුව වෙන් කොට හඳුනා ගැනීම සහ පැහැදිලි කිරීම මෙම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ. රාජ්‍යය සහ ආණ්ඩුව යන සංකල්ප දෙක වෙන වෙනම විස්තර කර තිබීම පමණක් සම්පූර්ණ පිළිතුරක් නොවේ. ඒ දෙකෙහි වෙනස්කම් ද, සම්බන්ධතා ද සාකච්ඡා කිරීම පිළිතුර සම්පූර්ණ වීමට අවශ්‍ය වේ.

**අන්තර්ගතය**

පිළිතුර පහත සඳහන් පරිදි සකස් විය යුතුය.

**හැඳින්වීම (ලකුණු 02)**

රාජ්‍යය සහ ආණ්ඩුව යන සංකල්ප දෙක දේශපාලන විග්‍රහයේ මූලික සංකල්ප වන අතරම, ඒවා දේශපාලන ජීවිතයේ මූලික ආයතන බව ද ප්‍රකාශ කරමින් සිදුකරන හැඳින්වීම. එම සංකල්ප දෙකෙහි අර්ථකථන ඉදිරිපත් කිරීම ද අපේක්ෂා කෙරේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 06)**

- රාජ්‍යය සහ ආණ්ඩුව අතර ඇති වෙනස්කම් මෙන්ම සම්බන්ධතා, ඒ දෙක අතර ආයතනික වශයෙන් ඇති අන්‍යෝන්‍ය පැවැත්ම ද ප්‍රකාශ වන ආකාරයට පැහැදිලි කර තිබීම. මෙහිදී පහත සඳහන් කරුණු විස්තර කර තිබිය යුතුය.
  - රාජ්‍ය දේශපාලන ප්‍රජාවක දේශපාලන නිදහස සහ ස්වාධිපත්‍යය ප්‍රකාශ කරන, එම සමාජයේ ඇති උත්තරීතර දේශපාලන ආයතනය බව.
  - රාජ්‍යය සාපේක්ෂ වශයෙන් දීර්ඝකාලීන සහ ස්ථාවර පැවැත්මක් ඇති, සමාජයේ සිටින සෑම පුද්ගලයෙකුගේම අවනතභාවය අපේක්ෂා කරන එකම දේශපාලන ආයතනය වීම.
  - ආණ්ඩුව රාජ්‍යය සමන්විත වන්නාවූ, රාජ්‍යයේ අංගයක් පමණක් වීම.
  - ආණ්ඩුව රාජ්‍යයේ නියෝජිතයාය. එමෙන්ම රාජ්‍යයේ අධිෂ්ඨානය ප්‍රකාශයට පත් කරන සහ ක්‍රියාවට නංවන ආයතන පද්ධතියෙන් සහ ඒවාට සම්බන්ධ පුද්ගලයන්ගෙන් ද සමන්විත වන බව පෙන්වා දීම.
  - රාජ්‍යය, සමාජයේ ප්‍රබලතම සහ උත්තරීතර දේශපාලන ආයතනය වුවත්, එය දෘශ්‍යමාන යථාර්ථයක් නොවේ. එහි වියුක්තභාවයක් තිබේ. ඊට වෙනස්ව ආණ්ඩුව දෘශ්‍යමාන ආයතන සහ පුද්ගලයින්ගෙන් සමන්විත වේ. ආණ්ඩුව යනු රාජ්‍යයේ ඇති දෘශ්‍යමාන යථාර්ථයයි.
  - රාජ්‍යය සහ ආණ්ඩුව එකක් නොව දෙකකි. එය වඩාත් හොඳින් පෙනෙන්නේ නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවලය. පූර්ව - ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම වල රාජ්‍යය සහ ආණ්ඩුව එකක් ලෙස සැලකිණි. ''රාජ්‍යය මායි, මා රාජ්‍යයයි'' යන ප්‍රංශයේ XIV ලුවී රජුගේ ප්‍රකාශයෙන් සංකේතවත් වූයේ ඒ අදහසයි.
  - ආණ්ඩුව රාජ්‍යයේ තාවකාලික නියෝජිතයා බවට වඩා පැහැදිලිව ප්‍රකාශ වන්නේ නූතන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවලය. ආණ්ඩුව පත්වන්නේ සීමිත කාලයකටය. එය මහජනයා විසින් පත් කරනු ලැබීමට ද, ඉවත් කරනු ලැබීමට ද, යටත් වේ. එය සිදුවන්නේ සාමකාමීවය. එහෙත් රාජ්‍යයක් ඉවත් කිරීමට විප්ලවයක් අවශ්‍ය වේ. එය බොහෝ විට ප්‍රචණ්ඩකාරීය.

**නිගමනය (ලකුණු 02)**

ඉහත කී ආකාරයේ මූලික වෙනස්කම් තිබුණ ද, රාජ්‍යය හා ආණ්ඩුව අතර ඇත්තේ අන්‍යෝන්‍ය පැවැත්මකි. ආණ්ඩුවක් නොමැතිව රාජ්‍යයට ද, රාජ්‍යය නොමැතිව ආණ්ඩුවට ද පැවතිය නොහැකි ය. පුරවැසියන් රාජ්‍යය සමග සම්බන්ධතා පවත්වන්නේ ද, රාජ්‍යය පුරවැසියන් සමග සම්බන්ධතා පවත්වන්නේ ද ආණ්ඩුව මධ්‍යකොටගෙනය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 03.iii රාජ්‍යය සහ ජාතිය

### අරමුණ

මෙම මාතෘකාවෙන් අදහස් කරන්නේ, රාජ්‍යය හා ජාතිය යන දේශපාලන විද්‍යාවේ මූලික සංකල්ප දෙක සහ ඒ දෙකේ අන්තර් - සම්බන්ධතා පිළිබඳව අපේක්ෂකයන් සතු අවබෝධය පරීක්ෂා කිරීමයි.

### අන්තර්ගතය

මෙම පිළිතුරේ පහත සඳහන් කරුණු පැහැදිලි කිරීම අපේක්ෂා කෙරේ.

### හැඳින්වීම (ලකුණු 02)

රාජ්‍යය සහ ජාතිය යන සංකල්ප දෙක දේශපාලන න්‍යායේත්, දේශපාලන ජීවිතයේත් ප්‍රධාන සංකල්ප දෙකක් බවත්, රාජ්‍යය සහ ජාතිය අතර ඇති සම්බන්ධතා තේරුම් ගැනීම, නූතන ලෝකයේ මෙන්ම ලංකාවේ ද දේශපාලනය තේරුම් ගැනීමට නැතිවම බැරි බවත් පෙන්වා දීම. මෙහිදී මෙම සංකල්ප දෙකේ අර්ථකථන ඉදිරිපත් කිරීම ද අවශ්‍යය.

### සාකච්ඡාව (ලකුණු 06)

- රාජ්‍යය සහ ජාතිය එකම අර්ථ දෙන සංකල්ප ලෙස ව්‍යවහාරයේ දී සැළකෙන බව නිදසුන් සහිතව පෙන්වා දීම. නූතන ''ජාතික - රාජ්‍යය'' යන සංකල්පයෙන් ඒ බව ප්‍රකාශ වන බව පෙන්වා දීම. නූතන ජාතික - රාජ්‍යයේ ආරම්භය සහ රාජ්‍යයේ අනන්‍යතාව සහ ජාතියේ අනන්‍යතාව එක ලෙස සැලකීමේ සම්ප්‍රදාය ගැන මෙහිදී සඳහන් කළ හැකිය.
- එසේ වුවත්, රාජ්‍යය සහ ජාතිය යන සංකල්ප දෙක අතර, වර්තමානයේ සංකීර්ණතා ඇති වී තිබෙන බව පෙන්වා දිය යුතුය. මෙහිදී රාජ්‍යයක් ඇතුළත, ජනවාර්ගික කණ්ඩායම් තම වාර්ගික අනන්‍යතාව හා දුක්ගැනවිලි පදනම් කරගෙන දේශපාලන අයිතිවාසිකම් ඉල්ලීම නිසා මෙම සංකීර්ණතා මතු වී තිබේ.
- මේ නිසා එක් ජාතික රාජ්‍යයක් තුළ ජීවත් වන පුරවැසියන් ''භාෂාමය, සංස්කෘතික, ආගමික ආදී වශයෙන් එකම අනන්‍යතාවක් සහිත ඒකාබද්ධ ජාතියකි.'' යන මූලධර්මය අර්බුදයට පත් වී තිබෙන බව පෙන්වා දිය යුතුය. තනි රාජ්‍යයක් තුළ ජීවත් වන විවිධ භාෂා, ආගමික හා සංස්කෘතික අනන්‍යතා සහිත ''උප - ජාතික'' කණ්ඩායම් කිහිපයකින් ද ''ජාතිය'' සමන්විත විය හැකිය යන අදහස, දේශපාලන න්‍යායේ ''ජාතිය'' යන සංකල්පයෙන් වර්තමානයේ අදහස් වේ. එවැනි රාජ්‍ය දේශපාලන න්‍යායේ හඳුන්වනු ලබන්නේ ''බහු-වාර්ගික'' හෝ ''බහු - ජාතික රාජ්‍ය'' යන සංකල්පයෙනි.
- මේ විග්‍රහය පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය නිදසුන් ලංකාවෙන්, ඉන්දියාවෙන් සහ අනෙක් රටවල්වලින් ද ලබා ගත හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිගමනය (ලකුණු 02)**

- මෙම පසුබිම තුළ 'ජාතිය' යන සංකල්පයේත් ''ජාතික - රාජ්‍යය'' යන සංකල්පයේත් සාම්ප්‍රදායික අර්ථය දැන් වෙනස් වී තිබෙන බවත්, රාජ්‍යය හා ජාතිය අතර සම්බන්ධතාව පිළිබඳව දේශපාලන න්‍යායේ පැවැති සාම්ප්‍රදායික තේරුම් ගැනීම දැන් වෙනස් වී තිබෙන බවත් නිගමනය කළ හැකි බව ප්‍රකාශ කළ හැකිය.

**3. iv ආණ්ඩු බලය සංවරණය කිරීමේ මාධ්‍ය**

**අරමුණ**

මෙම මාතෘකාවේ අරමුණ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන න්‍යාය තුළ ආණ්ඩුව පුරවැසි නිදහස සහතික කිරීම යන වගකීම ඉටු කිරීම පිළිබඳ මූලධර්ම සංකල්පගත කර ඇති ආකාරය සහ එය සාක්ෂාත් කර ගැනීමට ඇති මාධ්‍ය පිළිබඳව සිසුන් සතු දැනුම පරීක්ෂා කිරීමය.

**අන්තර්ගතය**

**හැඳින්වීම (ලකුණු 02)**

ආණ්ඩු බලය සංවරණය කිරීම සඳහා මාධ්‍ය සැපයීම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයේ මූලික මූලධර්මයක් බව පෙන්වා දෙමින් පිළිතුර ආරම්භ කළ හැකි ය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- ආණ්ඩු බලය සංවරණය සහ තුලනය කිරීම, නූතන ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායේ සංකල්පයක් බවත්, අණ්ඩු බලය සංවරණය කිරීමේ අරමුණ පුරවැසි නිදහස සහතික කිරීම බවත් පෙන්වා දෙමින්, එය නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයේත්, දේශපාලන භාවිතයේත් වැදගත් මූලධර්මයක් බව පෙන්වා දීම.
- ''ආණ්ඩු බලය සංවරණය කිරීම'' බලතල බෙදීමේ සිද්ධාන්තය සමග සම්බන්ධ වී ඇති ආකාරයත්, එය ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මුලින්ම ප්‍රකාශයට පත්වීමත් පිළිතුරේ ඊළඟට සඳහන් කළ හැකිය.
- ආණ්ඩු බලය කේන්ද්‍රගතවීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාපීඩක ඒකාධිපති පාලන තන්ත්‍ර බිහිවීමත්, ඒ මගින් පුරවැසි නිදහස සහ අයිතිවාසිකම් උල්ලංඝණය වන ආකාරයත් පැහැදිලි කර තිබීම.
- ආණ්ඩු බලය සංවරණය කිරීමේ මාධ්‍ය හඳුන්වා ඒවා විස්තර කිරීම. එම මාධ්‍ය කණ්ඩායම් දෙකකට බෙදිය හැකිය.

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

i. න්‍යායික මූලධාර්මික මාධ්‍ය

මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය පිළිබඳ ඉගැන්වීම්වලත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුලත් ගැබ් වී තිබේ.

ii. ප්‍රායෝගික මාධ්‍ය

ප්‍රායෝගික දේශපාලනයේදී ආණ්ඩු බලය සංවරණය කිරීමේ යාන්ත්‍රණ.

- න්‍යායික මූලධාර්මික මාධ්‍ය

  ආණ්ඩු බලය ආයතනික වශයෙන් කේන්ද්‍රගත නොවීම අවධාරණය කරන බලතල වෙන් කිරීම, නීතියේ ආධිපත්‍යය, මානව අයිතිවාසිකම්, ස්වාධීන අධිකරණය, විධායකය ව්‍යවස්ථාදායකයට වගකීම, නිදහස් සහ සාධාරණ මැතිවරණ.

- ප්‍රායෝගික මාධ්‍ය

  සිවිල් සමාජ ව්‍යාපාර, මහජන මතය, නිදහස් ජනමාධ්‍ය, ආණ්ඩුවේ කටයුතු අධීක්ෂණය කරන ස්වාධීන කොමිෂන් සභා, සක්‍රීය පුරවැසියන්, ශක්තිමත් සහ සක්‍රීය විරුද්ධ පක්ෂ.

**නිගමනය (ලකුණු 02)**

ආණ්ඩුවේ බලය සංවරණය කිරීමත්, ඒ සඳහා ඇති ව්‍යවස්ථාමය, නෛතික සහ ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීමත්, පුරවැසි නිදහස සහතික කිරීමත්, සෞඛ්‍ය සම්පන්න ප්‍රජාතන්ත්‍රවාදි දේශපාලන ක්‍රමයකට අත්‍යවශ්‍ය බව පෙන්වා දෙමින් පිළිතුර අවසන් කළ හැකියි. ඒ සඳහා පුරවැසියන් සතු වගකීම ද අවධාරණය කළ හැකිය.

**4.** පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳව සාකච්ඡා කරන්න.

(i) කැබිනට් ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
(ii) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
(iii) මිශ්‍ර ආණ්ඩුක්‍රමයක විධායකය
(iv) ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

**අරමුණ**

මෙම ප්‍රශ්නයේ අරමුණ ලෝකයේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම මාදිලි (ආකෘති) සම්බන්ධයෙන් අපේක්ෂකයා සතු දැනුම පරික්ෂා කර බැලීමය. ඒ යටතේ ප්‍රශ්නය කොටස් හතරකින් සමන්විතය. එයින් ඕනෑම කොටස් **දෙකක්** තෝරාගෙන පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

### 04. i කැබිනට් ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

**අරමුණ**

මෙම කොටසින් බලාපොරොත්තු වන්නේ සෙසු ආණ්ඩුක්‍රම වලින් කැබිනට් ආණ්ඩුක්‍රමය වෙන්කොට හඳුනාගැනීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීමය.

**හැඳින්වීම (ලකුණු 02)**

කැබිනට් ආණ්ඩුක්‍රම මාදිලිය විධායක බලය සංවිධානය කර ඇති ආකාරය අනුව ආණ්ඩුක්‍රම වර්ගීකරණයට යොදාගන්නා ක්‍රමයක් බව පැහැදිලි කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- මෙම ආණ්ඩුක්‍රමයේ විශේෂතම ලක්ෂණය වන්නේ ව්‍යවස්ථාදායකය තුළින් විධායකය ව්‍යුත්පන්න වීමයි.
- එනයින් ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර සමීප සම්බන්ධතාවක් නොහොත් අන්තර් පරායත්තතාවක්, දැකිය හැකිය.
- කැබිනට් ආණුක්‍රමයක විශේෂ ලක්ෂණයක් වන්නේ උත්සවාකාර/ නාමික විධායකයක් හා තථ්‍ය හෙවත් සැබෑ විධායකයක් යනුවෙන් විධායකයන් දෙකක් පැවතීම.
- තථ්‍ය විධායකය නෙහොත් කැබිනට් මණ්ඩලය විසිරයාමත් සමග ව්‍යවස්ථාදායකය ද විසිර යයි.
- විධායකය බලයෙන් නෙරපා දැමීමට ව්‍යවස්ථාදායකයට ඇති හැකියාව. ඒ හැකියාව ලැබෙන අවස්ථාව නම්:
    - විශ්වාසභංග යෝජනාවක් සම්මත වීම.
    - රාජාසන කථාව පරාජයට පත්වීම.
    - අයවැය ලේඛණය පරාජයට පත්වීම.
    - ආණ්ඩුවේ වැදගත් පනතක් ව්‍යවස්ථාදායකය තුළ පරාජයට පත්වීම.
- කැබිනට් ආණ්ඩුක්‍රමය වඩාත් සාර්ථක වීමට ද්වි පක්ෂ ක්‍රමයක් අවශ්‍ය වීම.
- එකම මැතිවරණයකින් ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ හෝ ඉරණම තීරණය වීම.
- සෙසු ආණ්ඩුක්‍රම හා සන්සන්දනය කිරීමේදී බලතල බෙදීමේ සිද්ධාන්තය ක්‍රියාත්මක නොවීම.
- දේශපාලන විධායකය සතු සාමූහික වගකීම.

**නිගමනය (ලකුණු 02)**

ඉහත සාකච්ඡාව සම්පිණ්ඩනය කරමින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට හිතකර පාලන ක්‍රමයක් වුවත් සාපේක්ෂ වශයෙන් අස්ථාවර ආණ්ඩුක්‍රමයක් බවට පත්විය හැකි බව සඳහන් කරමින් පිළිතුර අවසන් කරන්නේ නම් සාර්ථක පිළිතුරකි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

### 4. ii ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

**අරමුණ**

මෙම කොටසේ අරමුණ වන්නේ ජනාධිපති ආණ්ඩුක්‍රමය රාජ්‍යයක විධායක බලය සංවිධානය කිරීමේ එක් සුවිශේෂ ආණ්ඩුක්‍රම මාදිලියක් බව පැහැදිලි කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීමයි.

**හැඳින්වීම (ලකුණු 02)**

ජනාධිපති ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලය බෙදා වෙන් කොට සංවරණ හා තුලන මූලධර්මය ක්‍රියාත්මක වන රාජ්‍යවල විධායකය සංවිධානය කිරීම සඳහා භාවිතයට ගෙන ඇති ආණ්ඩුක්‍රමයක් ලෙස පැහැදිලි කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සමීප සම්බන්ධතාවක් නොමැති අතර පත්වන්නේ වෙන වෙනම පවත්වන මැතිවරණ වලින් බව පැහැදිලි කිරීම.
- ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ ධූරකාල සමගාමී නොවීම.
- පක්ෂ දේශපාලන හේතුමත විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට නොහැකි වීම. දෝෂාභියෝග යෝජනා මත පමණක් නිශ්චිත නීතිමය ක්‍රියාවලියක් තුළින් පමණක් ඉවත් කළ හැකි වීම.
- බලතල වෙන් කිරීමේ මූලධර්මය හා සංවරණ තුලන ක්‍රමයක් අන්තර්ගත වී තිබීම.
- සාපේක්ෂ වශයෙන් ස්ථාවර හා කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයක් විම.
- ව්‍යවස්ථාදායකය විසුරුවා පැවතුනද විධායකය ක්‍රියාත්මක වීම.

**නිගමනය (ලකුණු 02)**

පිළිතුරේ අන්තර්ගතය සාරාංශ කරමින් සාපේක්ෂ වශයෙන් ස්ථාවර ආණ්ඩුක්‍රමයක් වුවත් ජනාධිපති ආණ්ඩුක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදි ජීවගුණයෙන් අඩු ආණ්ඩුක්‍රමයක් බව පැහැදිලි කර තිබීම.

### 4. iii මිශ්‍ර ආණ්ඩුක්‍රමයක විධායකය

**අරමුණ**

මිශ්‍ර ආණ්ඩුක්‍රමයක් යනු දෙමුහුන් ආණ්ඩුක්‍රමයක් යනුවෙන්ද හැඳින්වෙන ආණ්ඩුක්‍රමයයි. මෙම ක්‍රමයේ විශේෂ ලක්ෂණය වන්නේ කැබිනට් හා ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ මිශ්‍ර කර ගනිමින් විධායක බලය සහිත ජනාධිපතිවරයෙකුටත් අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයකටත් ක්‍රියාත්මක වීමට ඉඩ සැලැස්වීමයි. මේ පිළිබඳව පැහැදිලි කිරීමට ඇති හැකියාව මැන බැලීම මේ මාතෘකාවේ අරමුණයි.



www.alevelapi.com
උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**හැඳින්වීම (ලකුණු 02)**

අපේක්ෂකයා මේ ආණ්ඩුක්‍රමය ජනාධිපති ආණ්ඩුක්‍රමයක පවතින ඇතැම් ලක්ෂණත් කැබිනට් ආණ්ඩුක්‍රමයක ඇතැම් ලක්ෂණත් මිශ්‍ර කරගනිමින් රාජ්‍යයේ විධායකය ගොඩනැගීමට අනුගමනය කර තිබෙන මාදිලියකැයි හඳුන්වා දෙමින් පිළිතුර ආරම්භ කළ හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- මිශ්‍ර ආණ්ඩුක්‍රමයක වෙන් වෙන් මැතිවරණවලින් පත්වන ජනාධිපතිවරයෙකු හා අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයක් ක්‍රියාත්මක වීම.
- ජනාධිපතිවරයා පක්ෂ දේශපාලන හේතු මත ඉවත් කිරීමට නොහැකි වුවත් අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයේ ඉරණම ව්‍යවස්ථාදායකයේ තීරණ මත රඳා පැවතීම.
- ජාතික වශයෙන් වැදගත් වන බලතල හා කාර්යභාරයන් සමූහයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම හඳුනාගෙන ඒවා ජනාධිපතිවරයාගේ විෂය පථයට පවරා දී තිබීම.
- අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටියද ජනාධිපතිවරයා එවැනි වගකීමකට බැඳී නොසිටීම.
- මෙවැනි විධායක ක්‍රමයකට සාර්ථක වීමට නම් ව්‍යවස්ථාදායකයේ බහුතර බලය හිමි කණ්ඩායමත් ජනාධිපතිවරයාත් අතර සහයෝගී චර්යාවක් අවශ්‍ය වීම. විශේෂයෙන්ම මෙය වැදගත් වන්නේ ජනාධිපතිවරයා එක් පක්ෂයකින් ද ව්‍යවස්ථාදායකයේ බහුතර බලය වෙනත් දේශපාලන පක්ෂයකට ද හිමි වී ඇති අවස්ථාවකදීය.

**නිගමනය (ලකුණු 02)**

ඉහත අන්තර්ගතය සාරාංශ කරමින් මේ ආණ්ඩුක්‍රමය සාර්ථක වීමට නම් ව්‍යවස්ථාදායකය හා ජනාධිපතිවරයා අතර සහයෝගී චර්යාවක් තිබිය යුතු බව අවධාරණය කළ යුතු ය.

**04. iv ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ**

www.alevelapi.com

**අරමුණ**

මෙම කොටසින් බලාපොරොත්තු වන්නේ ඒකීය ආණ්ඩුක්‍රමය රාජ්‍ය බලය සංවිධානය කොට තිබෙන ආකාරය අනුව ආණ්ඩුක්‍රම වර්ගීකරණය සඳහා යොදාගනු ලබන ආණ්ඩුක්‍රම වර්ගීකරණයක් බව පැහැදිලි කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීමයි.

**හැඳින්වීම (ලකුණු 02)**

ඒකීය ආණ්ඩුක්‍රමය යනු රාජ්‍යයේ බලය සංවිධානය කොට තිබෙන ආකාරය අනුව කරනු ලබන ආණුඩුක්‍රම වර්ගීකරණයක් බවත් ඒ ක්‍රමය යටතේ රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන සෙසු තලවල ආණ්ඩු අභිබවා මධ්‍යම ආණ්ඩුව ශක්තිමත්ව හා ප්‍රබලව ක්‍රියාත්මක වන බවට පැහැදිලි කරමින් පිළිතුර ආරම්භ කළ හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 06)**

- ශක්තිමත් මධ්‍යගත දේශපාලන බල අධිකාරයක් නොහොත් මධ්‍යම ආණ්ඩුවක ක්‍රියාකාරීත්වය. මින් සෙසු තලවල ආණ්ඩු ක්‍රියාත්මක වන්නේ නැතැයි අදහස් නොවේ. ඉන් ගම්‍ය වන්නේ රාජ්‍යයේ මධ්‍යම ආණ්ඩුවට සෙසු තලවල ආණ්ඩු අභිබවා ක්‍රියාත්මක වීමටත් ප්‍රාදේශීය මට්ටමේ ආණ්ඩු ආයතනවල ඉරණම ද තීරණය කිරීමට බලය මධ්‍යම ආණ්ඩුව සතුව පවතින බවය.
- මධ්‍යම ආණ්ඩුවේ නීති පැනවීමේ බලයට තරගකාරී ව්‍යවස්ථාදායකයන් නොමැතිවීම.
- සංධිය ක්‍රමයක් හා සැසඳීමේදී ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය සරල හා පහසු එකක් වීම.
- එක් මධ්‍යම ආණ්ඩුවක් පැවතියද පරිපාලන කාර්යක්ෂමතාව ඇතිකර ගැනිම සඳහා බොහෝ ඒකීය ආණ්ඩුක්‍රම සහිත රාජ්‍යයන් පරිපාලන බලතල විමධ්‍යගත කර තිබීම.
- රාජ්‍යයේ භූමි සීමාව තුළ මධ්‍යම ආණ්ඩුවේ බලය සහ අධිකාරිය පැහැදිලිව සහ නිශ්චිතව ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව නිසා ඒකීය ආණ්ඩුක්‍රමයක් තුළ දේශපාලන සහ සමාජ ඒකාග්‍රතාව පවත්වාගෙන යාමට ඇති හැකියාව.
- ඒකීය ආණ්ඩු ක්‍රමයක් සාර්ථකව ක්‍රියාවට නැංවිය හැක්කේ සජාතික/සමජාතික සමාජ වල යැයි පිළිගැනීමක් පවතියි.

**නිගමනය (ලකුණු 02)**

සාපේක්ෂ වශයෙන් කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකුණ ද ඒකීය ආණ්ඩුක්‍රමය බහු වාර්ගික සහ බහුවිධ සමාජවල අභියෝගවලට පාත්‍රව තිබෙන බව පිළිතුර සම්පිණ්ඩනය කර නිදසුන් සහිතව දක්වන්නේ නම් සාර්ථක පිළිතුරක් ලෙස සැලකිය හැක.

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** සාකච්ඡා කරන්න.

(i) ලංකා ජාතික සංගමය හා ජාතික ව්‍යාපාරය

(ii) ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය හා වර්ධනය

(iii) යටත්විජිත සමයේ ලංකාවේ ආගමික පුනර්ජීවන ව්‍යාපාර

(iv) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යුගයේ සුළුතර ප්‍රජාවන්ගේ දේශපාලනය

**අභිමතාර්ථය**

මෙම ප්‍රශ්නයේ අරමුණ ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේදී සිදුවූ සමාජ දේශාපාලන පරිවර්තනය තුළ මතු වූ සමාජ දේශපාලන ව්‍යාපර පිළිබඳ අපේක්ෂකයින් දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමයි. අපේක්ෂයින් තෝරා ගත යුතුතේ මාතෘකා **දෙකකි.**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 5 i. ලංකා ජාතික සංගමය සහ ජාතික ව්‍යාපාරය

මෙම මාතෘකාවේ අරමුණු යටත් විජිත ලංකාවේ බිහිවූ දේශපාලන සංවිධානයක් වූ ලංකා ජාතික සංගමය ගැනත්, ජාතික ව්‍යාපර තුළ එය ඉටු කළ භූමිකාව ගැනත් අපේක්ෂකයින් සතු දැනුම සහ අවබෝධය ඇගයීමට ලක් කිරීම.

**හැඳින්වීම (ලකුණු 02 )**

ජාතික ව්‍යාපාරයක් යනු අර්ථකථනය කරමින්, ලංකාවේ ජාතික ව්‍යාපාර ස්වභාවය ගැන කෙටි සඳහනක් කරමින් පිළිතුරු ඇරඹිය හැකිය. එමෙන්ම ලංකා ජාතික සංගමය පිහිටුවීමේ පසුබිම හා එහි දේශපාලනික ස්වභාවය ගැනත් කෙටියෙන් සඳහන් කළ හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- ලංකා ජාතික සංගමය බිහිවන විට, ප්‍රතිසංස්කරණ ගැන උනන්දුව දක්වූ සංවිධාන කිහිපයක්ම බිහිවී තිබිණ. ඒවා නම් ලංකා සමාජ ප්‍රතිසංස්කරණ ලීගය, ලංකා ප්‍රතිසංස්කරණ ලීගය සහ ලංකා ජාතික සංවිධානයයි. ජාතික සංගමය බිහිවීමට අවශ්‍ය පසුබිම ගොඩ නනග ලද්දේ ඒවා විසිනි.
- සංගමයේ මුල් කාලයේදී ජාතික සංගමයට, විවිධ වාර්ගික කණ්ඩායම් එකතු වී සිටිහ.
- ජාතික සංගමය ඉදිරිපත් කළේ මැදිහත්වාදී දේශපාලන ඉල්ලීමයි. ලංකාවේ වැසියන්ට, බ්‍රිතාන්‍ය කිරීටයේ අන් යටත් වැසියන් සමග සමානව සැළකිය යුතුය යන්න ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීමක් විය.
- ලංකා ජාකිත සංගමය, සමාජයේ ප්‍රභූ කොටස්වලට අයත් වූ ව්‍යාපාරයක් විය. එහෙයින් එය දේශපාලන වශයෙන් ගතානුගතිකවාදී ද විය. නිදසුනක් ලෙස 1931දී ලංකාවට සර්වජන ඡන්ද ලබාදීමේ දී එහි සමහර නායකයෝ එයට විරුද්ධ වූහ. ස්ත්‍රීන්ට ද, සාමාන්‍ය ජනතාවට ද ඡන්ද බලය ලැබුණහොත්, රටේ වියවුල් තත්ත්වයක් ඇති විය හැකි යැයි ප්‍රභූ නායකයෝ එකල සිතූහ.
- ඉන්දියානු ජාතික සංගමය සමග සසඳා බලන විට ලංකාවේ ජාතික සංගමය දේශපාලන වශයෙන් ගතානුගතික ව්‍යාපාරයක් විය. එය ලංකාවේ ජනතාවට පූර්ණ නිදහස සඳහා සටන් කළේ නැත.
- එසේ වූවත්, ලංකාවට නිදහස ලැබීමේ ක්‍රියාවලියට එය දායකත්වයක් කෙළේය. සෑම ජනවර්ගයකටම අයත් ප්‍රභූ කොටස්වලට, දේශපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳව සාකච්ඡා කිරීමේ වේදිකාව වූයේ ජාතික සංගමයයි.
- එසේ වුවත් 1921 මැනිං ප්‍රතිසංස්කරණ වලින් හඳුන්වා දුන් වාර්ගික නියෝජන ක්‍රමය සමග, සිංහල, දෙමළ හා මුස්ලිම් ප්‍රභූ නායකයින් අතර තිබ් සමගිය බිඳ වැටිණ. දෙමළ නායකයෝ ජාතික සංගමයෙන් කැඩී සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය පිහිටුවා ගත්හ. මේ කැඩීම, ලංකාවේ දේශපාලන ප්‍රභූන් අතර වාර්ගික දේශපාලනයේ ආරම්භය සළකුණු කළේය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සේවය

මෙවැනි සීමාවන් පැවතිය ද, ලංකාවේ යටත් විජිත පාලන කාලය තුළ දේශපාලනයට වැදගත් දායකත්වයක් කිරීමට ජාතික සංගමයට හැකි විය. ප්‍රතිසංස්කරණවලට ලැදි දේශීය ප්‍රභූ කොටස්වලට මුලින්ම දේශපාලන වේදිකාවක් සැපයූයේ ජාතික සංගමයයි.

ඒ සමගම මධ්‍යම පන්තික දේශපාලන නායකයින්ට ද, තම අදහස් සාකච්ඡා කිරීමට වේදිකාවක් ඒ මගින් ලැබිණ. එය ඔවුන්ට පසු කාලයේ සක්‍රීය දේශපාලනය සඳහා පුහුණු පාසලක් විය.

ලංකාවේ අනාගත දේශපාලන නායකයින් පුහුණු කිරීම ද එය විසින් කරන ලද වැදගත් සේවයකි. ඔවුන් බොහෝ දෙනා පසුව ලංකාවේ අධිපති දේශපාලන ප්‍රභූ තන්ත්‍රයේ සාමාජිකයෝ ද වූහ.

ජාතික ව්‍යාපාරයක් ලෙස ජාතික සංගමයේ දේශපාලනයේ සීමාවන් ද තිබිණ. ඉන්දියානු ජාතික සංගමය සමග සැසඳීමේ දී එම සීමාකම් වඩාත් කැපී පෙනිණ.

**නිගමනය (ලකුණු 02)**

මෙහිදී ඉහත සාකච්ඡා සාරාංශ කරමින්, ඒ මත පදනම් වූ නිරීක්ෂණ ඉදිරිපත් කළ හැකිය. එය නූතන ලංකාවේ දේශපාලන පිබිදීමේ ආරම්භක මෙන්ම වැදගත්ම සංවිධානයක් විය. එය දේශපාලන පක්ෂයකට වඩා පුළුල් දේශපාලන ව්‍යාපාරයක් ද විය. එහෙත් එයට, ලංකාවේ බිහි වූ වාර්ගික බෙදීම් ජය ගැනීමට නොහැකි විය.

**5.ii ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ බිහිවීම හා සංවර්ධනය**

**අරමුණ**

www.alevelapi.com

මෙම මාතෘකාවේ අරමුණ වාමාංශික ව්‍යාපාරයේ උපත, සංවර්ධනය හා එහි දායකත්ත්වය පිළිබඳව ආපේක්ෂකයා සතු දැනුම පරික්ෂා කර බැලීමය. වාමාංශික ව්‍යාපාරය ලාංකික දේශපාලනයට කළ බලපෑමද ඇතුළත්ව තිබීම අවශ්‍යය.

**හැඳින්වීම (ලකුණු 02)**

අපේක්ෂකයන්ට තම පිළිතුර වාමාංශික ව්‍යාපාරය බිහි වූ පසුබිම යටත් විජිත හා පශ්චාත් යටත් විජිත යුගවල කළ බලපෑම හා ජාතික ව්‍යාපාරයට එයින් වූ බලපෑම සඳහන් කරමින් ආරම්භ කළ හැකිය. වාමාංශික ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්ත්වය වෘත්තීය සමිති සහ අධිරාජ්‍ය විරෝධය කම්කරු පංතික බලවේග තුළ මෙන්ම පාර්ලිමේන්තුවේ ද දක්නට ලැබුණි. මේ හැම තලයකදීම එහි බලපෑම පුළුල් විය. වාමාංශික ව්‍යාපාරය නිරන්තරයෙන් දුප්පතා හා පීඩාවට පත් වූවන් වෙනුවෙන් පෙනී සිට ඔවුන් වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්ති හැඩ ගැස් වීමට උත්සුකව ඇත.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 06)**

- මෙම ව්‍යාපාරයට මුල පිරුවෝ බටහිර සරසවිවල අධ්‍යාපනය ලැබූ රැඩිකල් තරුණ කණ්ඩායමකි. ඒ අය අතර වූ එන්. එම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන, කොල්වින් ආර් ද සිල්වා, එස් ඒ වික්‍රමසිංහ වැනි අයගේ නම් සඳහන් කළ යුතුය. මේ සියලු දෙනා යටත් විජිත හා අධිරාජ්‍ය විරෝධය පදනම් වූ ඉන්දියා හා අප්‍රිකා ව්‍යාපාරවලින් ආභාසය ලැබූවෝය.
- ඔවුහු මාක්ස්වාදී චින්තනයේ විවිධ ධාරාවලින් ආභාසය ලැබ ඉන්දීය නිදහස් අරගලයෙන් උත්තේජනය ලැබූවෝය.
- 1931 දි සර්ව ජන ඡන්දය ලබා දීම ව්‍යාපාරයට විශාල සහයක් ඔවුන්ගෙන් ලැබිණ.
- මෙම ව්‍යාපාරයේ සමාරම්භකයෝ 1930 දශකයේ දී අධ්‍යාපනය නිමවා ලංකාවට පැමිණ වෘත්තීය සමිති සහ අධිරාජ්‍ය විරෝධය කම්කරු පංතික බලවේගවලට එකතුව වැඩ කිරීමට කටයුතු කළහ.
- 1935 දෙසැම්බර් මස ලංකා සමසමාජ පක්ෂය ආරම්භ කිරීම ලංකාවේ දේශපාලනයේ සංධිස්ථානයකි. එය ලංකාවේ ඇති වූ ප්‍රථම නූතන දේශපාලන පක්ෂයයි. පක්ෂයේ මුල් වැඩපිළිවෙල විප්ලවකාරි වනවාට වඩා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී එකක් විය.
- 1936 මැතිවරණයට තරඟ කළ ඒ පක්ෂයේ සමාජිකයින් දෙදෙනෙකු වූ එන් එම් පෙරේරා සහ පිලිප් ගුණවර්ධන රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් ව, සාමාන්‍ය ජනතාවගේ දුක් පීඩා ප්‍රකාශ කරන වේදිකාවක් බවට එය පත් කර ගත්හ. එමෙන්ම පීඩිත ජනතාවගේ ප්‍රශ්නවලට යටත් විජිත ආණ්ඩුවේ අවධානයද යොමු කළහ.
- ලංකා සමසමාජ පක්ෂයේ ඇති වූ දෘෂ්ටිවාදී බෙදීමක් නිසා 1943 දී ඇති වූ ලංකා කොමියුනිස්ට් පක්ෂය බිහි විය. එය ලංකාවේ දෙවන වමේ පක්ෂයයි.
- නිදහසින් පසුව මෙම වාමාංශික පක්ෂ පාර්ලිමේන්තුවාදී පක්ෂ බවට පත් වූහ. ලංකාවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වීමට වමේ පක්ෂවලින් ලැබුණේ විශාල දායකත්වයකි.
- 1947 මැතිවරණයට තරඟ කළ ඒ පක්ෂ දෙක ආසන 18ක් දිනා ගැනිම සැලකිය යුතු ජයග්‍රහණයකි.
- හැම මැතිවරණයකටම තරඟ කළත් වමේ පක්ෂවලට බහුතර බලයක් දිනා ගැනීමට අපොහොසත් වූහ. එසේ වුවත් වමේ පක්ෂ පාර්ලිමේන්තුව ඇතුළත් ශක්තිමත් බලවේගයක් ලෙස ක්‍රියාකර ඇත.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- මෙයට බලපා ඇති කරුණු අතර වමේ පක්ෂවල ඇති මතවාදී වෙනස්කම් හා බෙදීම්ද එක්සත් ජාතික පක්ෂයට විකල්පය ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මතුව ඒමත් සඳහන් කළ හැකිය.
- වමේ පක්ෂ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග ඇති කර ගත් සහාග නිසා වමේ ව්‍යාපාරය තවත් දුර්වල විය.
- ඉහත තත්ත්වය හමුවේ තරුණ කොටස් සාම්ප්‍රදායික වමේ ව්‍යාපාරයෙන් ඉවත්ව ජනතා විමුක්ති පෙරමුණ බිහිකර ගැනීමට හේතු විය.
- එය විප්ලවීය උත්සාහ දෙකකට උත්සාහ කොට අසාර්ක වූ පසු මැතිවරණ දේශපාලනයට පිවිසියේ ය.

**නිගමනය (ලකුණු 02)**

නිගමනයට පිලිතුරේ සාරාංශයක් හා වමේ ව්‍යාපාරය දිනාගත් දේ ගැන ඇගයීමක් මෙන්ම සීමාකම් පිළිබඳව විවේචනයක් ද ඇතුළත් කළ යුතුය. ඒ සමගම යටත් විජිත යුගයේ පටන්ම ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයට සහ සුළුජන කොටස්වලත්, පීඩිත ජනතාවගේත් අයිතීන් ආරක්ෂා කිරීමට වාමාංශික ව්‍යාපාරය සිදු කළ දායකත්වය ගැන ද සඳහන් කළ හැකිය.

**5.iii ලංකාවේ ආගමික පුනර්ජීවන ව්‍යාපාරය**

මෙම තේමාවෙන් බලාපොරොත්තුවන්නේ ආගමික පුනර්ජීවන ව්‍යාපාර මතු වූ පසුබිම සහ ඒවායේ කටයුතු හා ජයග්‍රහණ ගැන අපේක්ෂකයාට ඇති අවබෝධය මැන බැලීමය. අපේක්ෂකයාට ආගමික පුනර්ජීවන ව්‍යාපාරය යන්නෙහි අරුත් දක්වා, යටත් විජිත ජනතාවන්ගේ කණ්ඩායම් අනන්‍යතා ගොඩ නැගීමෙහිලා ඒවා වෙත තිබූ හැකියාව ගැන අදහස් දැක් විය හැකිය.

**හැදින්වීම (ලකුණු 02)**

අපේක්ෂකයා මෙහිදී ආගමික පුනර්ජීවන ව්‍යාපාර බිහි වූ පසුබිම පැහැදිලි කොට, ඒවා එක් එක් ප්‍රජා කණ්ඩායමේ අනන්‍යතා ගොඩ නංවා යටත් විජිත ලංකාවේ දේශපාලනයට බලපෑම් කළ බව සඳහන් කළ හැකිය. ඒ සමගම, සිංහල, දෙමළ සහ මුස්ලිම් සමාජවල ඇති වූ ජාතික ප්‍රබෝධයට සහ දේශපාලන පිබිදීමට, ආගමික පුනර්ජීවන ව්‍යාපාර ඉටු කර ඇත්තේ පුරෝගාමී කාර්යයකි.

**සාකච්ඡාව (ලකුණු 06)**

- ආගමික පුනර්ජීවන ව්‍යාපාර අරඹන ලද්දේ බෞද්ධ, හින්දු සහ මුස්ලිම් යන ප්‍රජාවල උගත් කොටස් විසිනි. ඒ අයට ධනවත් පවුල්වල සහය ලැබිණ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- මේ ව්‍යාපාර බටහිර ආගමික හා සාරධර්මවලට එරෙහිව තම සංස්කෘතික ගරුත්වය නැවත අත්පත් කර ගැනීමට දැරූ උත්සාහයක් ද වේ.
- ඒ හෙයින් ඒ සියලු ව්‍යාපාර ක්‍රිස්තියානි ආගමට එරෙහි වූහ.
- බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාර ක්‍රිස්තියානි ආගම ව්‍යාප්තියට එරෙහි ප්‍රතික්‍රියා වශයෙන් පැහැදිළි කළ හැකිය.
- එහි මුල් ක්‍රියාකාරිත්වය නිරිත දිග මුහුදුබඩ ප්‍රදේශයේ ව්‍යාප්ත විය. එහි දි විවෘතව විවාද කිරිම, ආගමට හරවා ගැනීමට එරෙහි වීම හා බෞද්ධ අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම මගින් ක්‍රිස්තියානි ආධිපත්‍යයට අභියෝග කිරීම, බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ න්‍යාය පත්‍රය විය.
- මෙම ව්‍යාපාරයට සහයෝගය පරම විඥ්ඥානාර්ථ සංගමයෙන් ලැබුණි. එම සහයෝගය ක්‍රිස්තියානි මිෂනාරිවරුන්ට අභියෝග කිරීමේදී විශාල වශයෙන් වැදගත් විය.
- දහ නව වන ශතවර්ෂයේ අවසාන භාගයේ හා 20 වන සිය වසේ මුල් භාගයේ දී හික්කඩුවේ සුමංගල හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි හා අනගාරික ධර්මපාලතුමා යන අය මෙම බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ මූලික වූහ.
- ආගමික මෙන්ම ලෞකික අධ්‍යාපනයට ද අලුත් පාසල් මධ්‍ය කොටගෙන ව්‍යාප්ත වීම, බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ උත්සාහයේ දීර්ඝකාලීන ප්‍රතිඵල ඇති කළ කාර්යයකි.

**හින්දු පුනර්ජීවන ව්‍යාපාරය**

- උතුරු පලාතේ ඇති වූ හින්දු පුනර්ජීවන ව්‍යාපාරය ද ක්‍රිස්තියානි ආගම ව්‍යාප්තියට එරෙහි ප්‍රතික්‍රියාවක් වශයෙන් පැහැදිළි කළ හැකිය. එහි පුරෝගාමියා වූයේ ආරුමුග නවලාර් තුමාය. ඔහුට ආභාසය ලැබුනේ දකුණු ඉන්දියාවෙනි.
- ඔහු ශෛවවාදී උගතෙකු වූ අතර බයිබලය දෙමළට පරිවර්තනයට ද දායක වූවෙකි. ඔහු ශෛවවාදී උගතෙකු පමණක් නොව ක්‍රිස්තු මිෂනාරි අධ්‍යාපනය ද ලැබූවෙකි. ඔහුගේ මූලික අරමුණ වූයේ ශෛව අධ්‍යාපනය නූතන අධ්‍යාපනය සමග ලබා දීමය.
- දහ නව වන සිය වසේ අවසානයේ දී ඔහු නායකත්තවය දුන් ව්‍යාපාරය ක්‍රිස්තු හා බටහිර ව්‍යාපාරයට දැක් වූ ස්වදේශීමය ප්‍රතිචාරයක් වීය.
- ඔහු පාසල් අරඹා පත පොත ලියා හින්දු සංස්කෘතික සාරධර්මවල පුනර්ජීවනය අවධාරණය කළේය.
- බෞද්ධ හා හින්දු පුනර්ජීවන ව්‍යාපාරය අතර සමානතා දක්නට ලැබුණි. ක්‍රිස්තියානියට ප්‍රතිචාර දැක්වීම, සම්ප්‍රදායික සාරධර්ම යලි මතු කිරීම හා නූතන පාසල් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම ඒ අතර මුල් තැන ගනී.

**ඉස්ලාම් පුනර්ජීවන ව්‍යාපාරය**

- 19 වන සිය වසේ ඇති වූ ඉස්ලාම් පුනර්ජීවන ව්‍යාපාරයට බෞද්ධ හා හින්දු පුනර්ජීවන ව්‍යාපාර බල පෑවේය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- බෞද්ධ හා හින්දු පුනර්ජීවන ව්‍යාපාරවලින් එය උගත් පාඩම වූයේ ක්‍රිස්තියානි අධ්‍යාපන ආධිපත්‍යයට හොඳින් මුහුණ දිය හැක්කේ මුස්ලිම් දරුවන්ට වෙනම පාසල් ඇති කිරීම මගින් බවයි.
- මෙම ව්‍යාපාරයේ නායකයින් වූයේ සිද්දි ලෙබ්බේ හා ඔරාබි පාශාය.
- මෙම ව්‍යාපාරය මුස්ලිම් අනන්‍යතා හැඟීම වඩවා ලූ හෙයින් මුස්ලිම් දේශපාලන පිබිදීමට ද බල පෑවේය.

**නිගමනය (ලකුණු 02)**

නිගමනයට පිළිතුරේ සාරාංශයක් හා ආගමික පුනර්ජීවන ව්‍යාපාර දිනාගත් දේ හා එහි බලපෑම ගැන විවේචනයක් ඇතුළත් කළ යුතුය. බෞද්ධ, හින්දු, හා ඉස්ලාමීය ආගමික පුනර්ජීවන ව්‍යාපාරවලින් ලංකාවේ යටත් විජිත යුගයේ සංස්කෘතික අනන්‍යතා දේශපාලනයට පදනම වැටිණ. ඒ සමගම ඒවා මගින් ජන ප්‍රජාවන් අතර දේශපාලන පිබිදීම ද ආරම්භ විය. මෙම ව්‍යාපාර, යටත් විජිත ලංකාවේ වර්ධනය වූ වැදගත් සමාජ, සංස්කෘතික ව්‍යාපාර ද විය.

**5.iv ඩොනමෝර් යුගයේ සුළුතර කණ්ඩායම්වල දේශපාලනය**

පිළිතුරෙන් බලාපොරොත්තු වන්නේ මෙම යුගයේ දී වාර්ගික සුළුතර කණ්ඩායම්වල දේශපාලනය හැඩ ගැසුන ආකාරය ගැන අපේක්ෂකයාට ඒ ගැන ඇති අවබෝධය පරීක්ෂා කර බැලීමය. මෙහිදී මූලික අවධානය යොමුවන්නේ වාර්ගික සුළුතර කණ්ඩායම්වලය.

**හැඳින්වීම (ලකුණු 02)**

අපේක්ෂකයන්ට තම පිළිතුර ආරම්භයේ දී යටත් විජිත පාලකයින් නියෝජන අවස්ථා මුලදී සලසා තිබුනේ වාර්ගික පදනම මත වන බව පෙන්වා දී, සුළුතර වාර්ගික දේශපාලනයේ නැගීම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සමග ආරම්භ වී පරිණාමය වූ බව පැහැදිලි කළ හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- පූර්ව - ඩොනමෝර් යුගයේ ලක්ෂණය වූයේ වාර්ගික පදනම මත ව්‍යවස්ථාදායක සභාවෙහි නියෝජනය හිමි කර දීමය.
- යටත් විජිතයේ ආණ්ඩුකාරවරු ද වාර්ගික නියොජනය යන තුරුම්පුව භාවිත කළහ. එය සුප්‍රකට යටත් විජිත පාලන උපක්‍රමයක් වූ බෙදා පාලනය කිරීමේ ක්‍රියාමාර්ගයකි.
- ඩොනමෝර් ප්‍රතිසංකරණයෙන් නියෝජනය සඳහා යොදා ගත්තේ භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව යන මූලධර්මයයි. ඒ මගින් ඊට පෙර පැවැති වාර්ගික නියෝජනය අහෝසි කරනු ලැබිණ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- එය සාධාරණ නියෝජන ක්‍රමයක් ඇති කිරීම සඳහා පියවරක් වුව ද දෙමළ දේශපාලන නායකත්ත්වය එය දුටුවේ සිංහල බහුතර ආධිපත්‍යය ඇති කරන ක්‍රමයක් වශයෙනි.
- එයට අනාගතයේ තම ප්‍රජාවට ඇති විය හැකි නොසලකා හැරීම් පිළිබඳ අනතුරු ඇඟවීමක් ලෙස ද ඔවුහු දුටුවහ.
- එය වාර්ගික කණ්ඩායම් අතර සමතුලිත නියෝජන ක්‍රමයක් සඳහා වූ ඉල්ලීමට හේතු විය.
- ඩොනමෝර් යුගයේදී සිදු වූයේ ඊට පෙර ඇරඹී තිබුණ බහුතර-සුළුතර බෙදීම තවත් තියුණු වී, වාර්ගික අනන්‍යතා දේශපාලනය වඩාත් තහවුරු වීමයි.
- සුළුතර ආගමික සහ කුල ප්‍රජාවන්ගේ දේශපාලනය ගැන ද සඳහන් කර ඇත්නම්, ලකුණු දීමේ දී ඒ ගැන ද සැලකිලිමත් වන්න.

### නිගමනය (ලකුණු 02)

නිගමනයට පිළිතුරේ සාරාංශයක් හා වාර්ගික අනන්‍යතාව මත පදනම් වූ දේශපාලන තරඟය ඇති කළ ප්‍රතිවිපාක හා එහි බලපෑම ගැන සඳහන් කිරීමක් ඇතුළත් කළ යුතුය. මෙහිදී සඳහන් කළ හැකි නිරීක්ෂණයක් නම්, වාර්ගිකවාදී දේශපාලනය බිහිවීමේ සහ ව්‍යාප්තිය ලංකාවේ නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය සමග බැඳී තිබෙන බවයි. පසුව, වාර්ගික දේශපාලනය, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සහ මැතිවරණ දේශපාලනයේ ස්ථාවර අංගයක් බවට ද පත් විය.

**6.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව පවතින විවේචන කවරේදැයි පෙන්වා දෙන්න.

### අරමුණ

මේ ප්‍රශ්නයේ අරමුණ වන්නේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බිහිකරන ලද විධායක ජනාධිපති ක්‍රමය යැයි ප්‍රචලිත ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් එල්ල වී ඇති විවේචන සම්බන්ධයෙන් විචාරශීලීව විමසා බැලීමට අපේක්ෂකයා සතු දැනුම, කුසලතා හා ආකල්ප විමසා බැලීම ය.

### හැඳින්වීම (ලකුණු 03)

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඇතිකරනු ලැබූ ජනාධිපති ක්‍රමය රටවල් කිහිපයක ආභාසය ලබා පිහිටුවාගත් ක්‍රමයක් බව පැහැදිලි කිරීමෙන් පිළිතුර ආරම්භ කළ හැකිය. එංගලන්තය - ප්‍රංශය - ඇමෙරිකා එක්සත් ජනපදය එම ආකෘති වේ. ඒ සමගම, එම ව්‍යවස්ථාවේ තිබී දේශපාලන අරමුණු සහ එයින් ඇතිකරන ලද දේශපාලන ව්‍යුහය මත එය මහත් විවාදාත්මක ව්‍යවස්ථාවක් වූ බව ද ''හැඳින්වීමේදී'' කිව හැකිය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 14)**

- මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බිහිකළ ජනාධිපති තනතුර පුද්ගල අභිලාෂ සපුරා ගැනීම සඳහා ගොඩනැගූ බවට වන විවේචනය පැහැදිලි කිරීම. මේ සම්බන්ධව පවතින ප්‍රමුඛ ගණයේ විවේචනයක් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිර්මාපකයා ලෙස සැලකෙන ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ පුද්ගලික අභිරුචි අනුව නිර්මාණය කළේය යන විවේචනයයි.
- ඉහත විවේචනය සමගම සම්බන්ධ වී පවතින අනෙක් විවේචනය වන්නේ ජනාධිපතිවරයාට පවරා දී ඇති නෛතික මුක්තියයි.
  නෛතික මුක්තිය යනු පවත්නා නීතියෙන් රාජ්‍යය නායකයාව බැඳ නොතිබීමයි. මෙම නෛතික මුක්තිය හිමිවන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදායේ රාජ්‍ය නායකයාටය. මන්ද යත් ඔහු සැබෑ වශයෙන්ම පාලන ක්‍රියාවලියට සම්බන්ධ නොවන නිසාය.
  එහෙත් ලංකාවේ ජනාධිපතිවරයා සත්‍ය විධායක බලතල රාශියක් සමග සාම්ප්‍රදායික රාජ්‍යය නායකයකු භුක්තිවිඳින උත්සවාකාර බලතල ද භුක්ති විඳියි.
  මේ තත්වය අත්තනෝමතික හා අධිකාරවාදී පාලන ක්‍රමයකට ලංකාව රැගෙන ගොස් තිබෙන බව මේ සම්බන්ධයෙන් එල්ල වී ඇති තවත් ප්‍රබල චෝදනාවකි.
- ජනාධිපතිවරයාට පවරා දී තිබෙන සමාව දීමේ බලය අත්තනෝමතික හා හිතුවක්කාරී ලෙස භාවිතයට ගෙන ඇති බවට එල්ල වී ඇති චෝදනාඃ
  එම බලය සමස්ත දේශපාලන සංස්කෘතියේ ව්‍යුහයන් හා සංස්ථාවලත් බිඳවැටීමට හා දූෂණය වීමටත් හේතු වී තිබේය යනු තවත් ප්‍රබල විවේචනයකි.
- මෙම බලය රාජ්‍ය නායකයා සතු අසහාය බලයකි. මෙම බලය අයුතු ලෙස භාවිතයට ගෙන ඇති බවට විවේචන එල්ල වී ඇත.
- ලංකාවේ විධායක ජනාධිපතිවරයා තෝරාගනු ලබන්නේ වෙනම මැතිවරණයකිනි. අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය තේරී පත්වන්නේ වෙනම පවත්වන පාර්ලිමේන්තු මැතිවරණයකින් වුවත් ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ද වේ.
  එසේ වුවත් ජනාධිපතිවරයා විසින් මුලසුන දරුවද අමාත්‍ය මණ්ඩලයට එරෙහිව ඉදිරිපත් වන විශ්වාසභංග යෝජනාවක්, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පරාජයට පත්වීමක්, අයවැය පරාජයට පත්වීමක් වැනි අවස්ථාවල දී ධුරයෙන් ඉවත් වන්නේ අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය පමණි. ඒ හෙයින් මේ ක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකයත් විධායකයත් අතර ගැටුමේ ඵල විපාකවලට සැබෑ ලෙස මුහුණදෙන්නේ අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය පමණි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- මේ සම්බන්ධයෙන් එල්ල වී තිබෙන එක් ප්‍රබල විවේචනයක් වන්නේ ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයෙන් ප්‍රතිවාදියෙකු බවට පත් විය හැකි බවයි. ඒ ජනාධිපතිවරයාට ජනමත විමසුමක් - විචාරණයක් කැඳවීමට ඇති බලය නිසාය.
- අපේක්ෂකයින් 17, 18 සහ 19 සංශෝධන ද මෙම සාකච්ඡාවට සම්බන්ධ කර තිබේ නම් සුදුසු පරිදි ලකුණු ප්‍රදානය කරන්න.

**නිගමනය (ලකුණු 03)**

- කෙසේ වුවත් මේ සම්බන්ධයෙන් එල්ල වී ඇති විවේචන මධ්‍යයේ වුවත් මෙහි සාධනීය ලක්ෂණ හුවා දක්වන තර්ක කිහිපයක් ද දැකිය හැක.
- ජනාධිපති ක්‍රමයෙන් ජනවාර්ගික දේශපාලන සහයෝගතාව, දේශපාලන ස්ථාවරත්වය, ජාතික ඒකාග්‍රතාව ඇති කරණු ලබන බවට ගෙන එන තර්කය ඉන් එකකි.

  කෙසේ වුවත් මේ ක්‍රමයේ සාධනිය සහ නිශේධනීය පැතිකඩ හුවා දක්වමින් ප්‍රජාතන්ත්‍රීය පාලන ක්‍රමයකට එල්ල කර ඇති බලපෑම විවේචනාත්මක නිගමනයකට එළඹීම වැදගත් ය.

**7.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** විභාග කරන්න.
(i) 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ බලතල සහ කාර්යභාරය
(ii) 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ බලතල සහ කාර්යභාරය
(iii) 1972 ව්‍යවස්ථාව යටතේ අධිකරණය
(iv) 1978 ව්‍යවස්ථාව යටතේ අධිකරණය

**7.i 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ බලතල හා කාර්යභාරය**

**අභිමතාර්ථ**

මෙම පිළිතුරෙන් බලාපොරොත්තු වන්නේ 1972 ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ ජාතික රාජ්‍ය සභාව සතු බලතල සහ කාර්යයන් පිළිබඳව ඇති දැනුවත්භාවය සහ ඒ මගින් එම ආයතන සුවිශේෂත්වයට පත්ව තිබුණේ කෙසේ ද යන්න පිළිබඳව සිසුන් සතුව ඇති අවබෝධය පරීක්ෂා කිරීමයි.

**හැඳින්වීම (ලකුණු 02)**

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හැඳින්වූයේ ජාතික රාජ්‍ය සභාව යනුවෙනි. රාජ්‍යයේ ප්‍රබලතම ආයතනය ලෙස සියලු බලතල සංකේන්ද්‍රණය වූයේ, ජාතික රාජ්‍ය සභාව වෙතටයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 06)**

- ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලතල උත්තරීතර විය. ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලතල යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ ව්‍යවස්ථාවෙන් කොටසක් හෝ පරිච්ඡින්න කිරීමේ බලය ද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීමට ද බලය හිමි වන බව 44 වගන්තියේ සඳහන් ය.
- ජාතික රාජ්‍ය සභාවට හිමිවන ව්‍යවස්ථාදායක බලය අත්හැරීමට, පැවරීමට හෝ වෙන කිසිඳු ආකාරයකින් අන්සතු කිරීමට නොහැකි බව 45 වගන්තියේ දැක්වේ.
- නිශ්චය කරන ලද කාර්යයන් සම්බන්ධයෙන් අනු නීති සෑදීමේ බලය යම් කිසි තැනැත්තෙකුට හෝ ආයතනයකට නීතියෙන් පැවරිමට ජාතික රාජ්‍ය සභාවට බලය ඇත.
- මහජන මූල්‍ය පාලනය පිළිබඳ සම්පූර්ණ බලය ජාතික රාජ්‍ය සභාවට පැවරේ (84 වන වගන්තිය).
- ජාතික රාජ්‍ය සභාව වෙත සියලුම ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල සංකේන්ද්‍රණය වී ඇත.
- ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය බලය ජනතාව සතු වන අතර එය අත්හළ නොහැකි බව 3 වගන්තියේ දැක්වේ. එම පරමාධිපත්‍ය බලය ජනතාව විසින් තෝරා පත්කරගනු ලබන නියෝජිතයන්ගෙන් සමන්විත ජාතික රාජ්‍ය සභාවක් මගින් ක්‍රියාත්මක කෙරෙන බව 4 වගන්තියේ දක්වා ඇත.
- ජනරජයේ රාජ්‍ය බලයෙහි උත්තරීතර උපකරණය වන්නේ ජාතික රාජ්‍ය සභාවයි. ජාතික රාජ්‍ය සභාවට
  - ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ද, විධායක බලය ද, අධිකරණ බලය ද, හිමි බව 5 වගන්තියේ සඳහන් ය.
- මෙලෙස බලය සංකේන්ද්‍රණය වී ඇත්තේ ව්‍යවස්ථා නිර්මාණය කිරීමේ දී, බලතල බෙදීමේ සිද්ධාන්තය අනුගමනය නොකළ නිසා ය.
  - ජාතික රාජ්‍යය සභාව සතු බලතල හා කාර්යයන් කෙරෙහි වෙනත් කිසිඳු ආයතනයකට බලපෑම් කළ නොහැකි වීම පිළිබඳව 39 සහ 43 වගන්තිවල සඳහන්ය. ඒ අනුව ජාතික රාජ්‍ය සභාවේ කටයුතු කිසිදු අධිකරණයක කටයුතුවලට විෂය නොවන අතර ජාතික රාජ්‍ය සභාව විසින් පනවන ලද කිසිම නීතියක ව්‍යවස්ථානුකූලභාවය පරික්ෂා කිරීමට අධිකරණයට හෝ වෙනත් ආයතනයකට බලය නොමැති විය.
- එහෙත් ජාතික රාජ්‍ය සභාවට අනෙකුත් ආයතනවල ක්‍රියාකාරිත්වයට බලපෑම් කළ හැකි විය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- ජනාධිපතිවරයාට විරුද්ධව ගෙන එනු ලබන විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීමට ජාතික රාජ්‍ය සභාවට හැකි ය (26 (2) වගන්තිය)
- ජාතික රාජ්‍ය සභාවේ අනුමැතියකින් තොරව වෙනත් කිසිදු ආයතනයකට මුදල් සම්බන්ධ කිසිදු නීතියක් පැනවිය නොහැකි ය. (84 වගන්තිය)

- ජාතික රාජ්‍ය සභාවේ බලතල හා කාර්යභාරය තුළින් ''පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය'' සංකල්පය ඉස්මතු කෙරිණ.
  - මෙතෙක් පැවති ව්‍යවස්ථාදායක අතුරින් ''පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය'' සහිත එකම ව්‍යවස්ථාදායකය ලෙස ජාතික රාජ්‍ය සභාව යැයි හඳුනාගත හැකිය.

**නිගමනය (ලකුණු 02)**

1972 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කරන ලද ජාතික රාජ්‍යය සභාව ජනරජයේ ස්වාධිපත්‍ය බලය ක්‍රියාවට නැගීම අතින් සුවිශේෂතාවක් ගෙන තිබූ බව පිළිතුර තුළින් අවධාරණය වී තිබීම වැදගත් ය. ඒ අනුව ජාතික රාජ්‍යය සභාව තුල විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ බලය සංකේන්ද්‍රණය කිරීම මගින් එම සභාව ජනරජයේ උත්තරීතර ආයතනය බවට පත් වීම සම්බන්ධයෙන් නිගමනයේදී අවධානය යොමු කර තිබීම වැදගත් වේ. ඒ අතර, එම ව්‍යවස්ථාදායකයට සංවරණ සහ තුලන ක්‍රමයකට යටත් නොකිරීම නිසා, පාලක දේශපාලන පක්ෂය එම බලය අවභාවිතා කිරීම පිළිබඳව විවේචනයක් මතු වූ බව ද ප්‍රකාශ කළ හැකියි.

**7.ii. 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ බලතල සහ කාර්යභාරය**

**අභිමතාර්ථ**

මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ, 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත පාර්ලිමේන්තුවේ බලතල සහ කාර්යභාරය පිළිබඳව සිසු සිසුවියන්ගේ අවබෝධය පරීක්ෂා කිරීමයි. ඇතැම් අවස්ථාවල උදාහරණ ලෙස යොදාගන්නා ව්‍යවස්ථාවේ වගන්ති සඳහන් කිරීම ද සිසු සිසුවියන් විසින් කර තිබිය හැකිය. එවැනි අවස්ථාවල එම වගන්ති නිවැරදි දි යන්න පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය.

**හැඳින්වීම (ලකුණු 02)**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැලකෙන්නේ පාර්ලිමේන්තුවට නැතහොත් ව්‍යවස්ථාදායකයට වඩා ජනාධිපති නැතහොත් විධායකය බලවත් කරන ලද්දක් වශයෙනි. කෙසේ වුවද 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන ආ 19 වැනි සංශෝධනය මගින් පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන ඇති කෙරිණි. මේ අනුව 1978 මුල් ව්‍යවස්ථාවට වඩා වෙනස්ව, 19 වන සංශෝධනය මගින් පාර්ලිමේන්තුව බලාත්මක කිරීම ශ්‍රී ලංකාවේ දේශපාලනයේ වැදගත් සිදුවීමකි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**සාකච්ඡාව (ලකුණු 06)**

- ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාවගේ ඡන්දයෙන් තෝරා පත් කරගන්නා මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවක් මගින් පාර්ලිමේන්තුවක් මගින් සහ ජනමත විචාරණයක දී ජනතාව විසින් ක්‍රියාත්මක කළ යුතුය (4 වන වගන්තිය).
- රාජ්‍යයේ ප්‍රධාන නීති සම්පාදන ආයතනය ලෙස පාර්ලිමේන්තුව ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කළ ද 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට පරම බලයක් හිමි කර දී නැත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිච්ඡින්න කිරීමට, සංශෝධනය කිරීමට මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විධිවිධාන එකතු කිරීමට ද පාර්ලිමේන්තුවට බලය ඇත (75 වගන්තිය).
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන ආ 19 වැනි සංශෝධනය මගින් 1978 මුල් ව්‍යවස්ථාව යටතේ විධායකයේ බලයට යටත් වී තිබූ ව්‍යවස්ථාදායකය යම් ආකාරයකින් ස්වාධීන කර, වෙස්මින්ස්ටර් ආකෘතියට තරමක් සමාන ව්‍යුහයක් ඇති කෙරිණි.
- 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කළ 33 (අ) වගන්තියට අනුව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතුය.
- එසේම 19 වැනි සංශෝධනය මගින් පාර්ලිමේන්තුව අත්තනෝමතික ලෙස විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට තිබූ බලතල සීමා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 (1) වගන්තිය සංශෝධනය කෙරිණි. ඒ අනුව නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුලුව එහි මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ යෝජනා සම්මතයක් මගින් ඉල්ලා සිටියහොත් හැර, පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියමිත දිනයෙන් අවුරුදු හතරක් සහ මාස හයක කාලයක් අවසන් වන තෙක් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය නොහැකිය.
- පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙස මූල්‍ය පාලනය සහ මහජන ආරක්ෂාව වෙනුවෙන් නීති සම්පාදනය කිරීම හඳුනාගත හැකිය. විශේෂ අවස්ථාවලදී කාරක සභා ස්ථාපිත කර, ඒ හරහා නීති සම්පාදන කාර්යයන්ට සහ පරීක්ෂණ කටයුතුවලට දායකත්වය සැපයීම ද පාර්ලිමේන්තුව විසින් සිදුකරනු ලබන කාර්යභාරයක් වේ.
- 1978 ආණ්ඩුක්‍රම මුල් ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව දුර්වල වූ බවත්, එම ව්‍යවස්ථාවට ගෙන ආ 19 වැනි සංශෝධනයෙන් පාර්ලිමේන්තුව නැවත ශක්තිමත් වූ බවත් සඳහන් වීම වැදගත්ය.

**නිගමනය (ලකුණු 02)**

මේ පිළිතුරේදී 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට හිමිවන බලතල සහ කාර්යභාරය සාකච්ඡාවට ලක් කිරීමක් අපේක්ෂා කරන අතර ව්‍යවස්ථාවට සිදුකළ 19 වන සංශෝධනය මගින් පාර්ලිමේන්තුව කෙරෙහි විධායකයට කළ හැකි බලපෑම සීමා කිරීමට ඇති කළ ව්‍යවස්ථා ප්‍රතිපාදන පිළිබඳව නිගමනය තුළ අවධානයක් යොමුව තිබීම වැදගත් ය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 7. (iii). 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණය

### අරමුණු

ශ්‍රී ලංකාවේ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ අධිකරණය පිළිබඳව ශිෂ්‍යයන් සතු දැනුම හා අවබෝධය තක්සේරු කිරීම මෙම ව්‍යුහගත ප්‍රශ්නයේ අරමුණයි.

### හැඳින්වීම (උපරිම ලකුණු 02)

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5වන වගන්තිය ප්‍රකාරව, ජනරජයේ විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ යන ත්‍රිවිධ බලතලවල මූලය වන්නේ ජාතික රාජ්‍ය සභාවයි.

### සාකච්ඡාව_(ලකුණු 06)

- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ ජනවරමක් සහිතව සමගි පෙරමුණු රජය ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කිරීමේ අභිලාෂය ඇතිව සිටියේය. කෙසේ වෙතත් පැවති නෛතික යටිතලය තුළ එවැන්නක් සිදු කළ හැකිද යන ගැටලුව පැන නැගුණි. එබන්දක් නිර්මාණය කිරීම කෙරෙහි 1947 සෝල්බරි ව්‍යවස්ථාවේ 29(ii) වගන්තිය බාධකයක් බවට නීති විශාරදයින් විසින් ප්‍රකාශ කරන ලද අතර, නීති විශාරදයින් තුළ ද සැක මතු වී තිබුණි.
- ඉහත නෛතික බාධකය ඉවත් කර ගැනීම සඳහා 1972 ව්‍යවස්ථා සම්පාදකයින් සෝල්බරි ව්‍යවස්ථාව සංශෝධනය කරනු ලැබූ අතර, අභියාචනාධිකරණය පෙර පැවති ප්‍රිවි කවුන්සිලය ඉක්මවා යමින් ඉහළ අධිකරණය බවට පත් කෙරිණ.
- 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් 1947-1971 දක්වා පැවති අධිකරණ සේවා කොමිෂන් සභාව අහෝසි කරන ලද අතර, නෛතික වෘත්තීන්හි පරිපාලනය අරභයා

  (i) අධිකරණ සේවා උපදේශක මණ්ඩලය

  සහ

  (ii) අධිකරණ සේවා විනය මණ්ඩලය

  යන ද්විත්ව ආයතන ආමාත්‍ය මණ්ඩලයේ සහ ජාතික රාජ්‍ය සභාවේ බල වපසරිය තුළ පිහිටවනු ලැබුණි.

- 1972 ව්‍යවස්ථාව මගින් එතෙක් පැවති අධිකරණ ක්‍රමයේ සැලකිය යුතු වෙනසක් සිදු වූයේ නැත. එසේ වුවද, අධිකරණ ක්‍රමයේ වෙනසක් සිදු කිරීමට අවශ්‍ය වන විටෙක එය ජාතික රාජ්‍ය සභාව විසින් සාමාන්‍ය ඡන්දයෙන් සම්මත කරනු ලබන පනතක් මගින් සිදුකළ හැකි බව ව්‍යවස්ථාවෙහි 121 වන වගන්තියෙහි සඳහන් කෙරිණි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- 1971 දී ප්‍රිවි කවුන්සිලයට ලංකාවේ නඩුවක් අභියාචනා කිරීමට පැවති අයිතිය අහෝසි කිරීමෙන් පසුව එම කාර්ය පවරන ලද්දේ අළුතින් පිහිටුවන ලද අභියාචනාධිකරණය වෙත ය.
- 1972 ව්‍යවස්ථාව සම්මත වීමෙන් වසරක් ඉක්ම යාමෙන් පසුව අධිකරණ ක්‍රමයේ පූර්ණ වෙනසක් ඇති කිරීමේ අරමුණෙන් ජාතික රාජ්‍ය සභාව විසින් 1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනත සම්මත කරනු ලැබිණි.
- මෙම පනත සම්මත කිරීමෙන් අපේක්ෂා කළේ ශ්‍රී ලංකා ජනරජය තුල යුක්තිය පසිඳලීම සඳහා නව අධිකරණ පද්ධතියක් පිහිටුවීම, අධිකරණයන් හි අධිකරණ බල සීමාව නිශ්චය කිරීම, අධිකරණවල කාර්ය පරිපාටිය විධිමත් කිරීම, ඇතැම් ලිඛිත නීති ඉවත් කිරීම යනාදි සියළු කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම ය.
- මෙම පනත මගින් එතෙක් පැවති අධිකරණ ක්‍රමය වෙනුවට යුක්තිය පසිඳලීම සඳහා පහත සඳහන් ආයතන සංස්ථාපනය කරන ලදි. ඒවා නම්,
    1. ශ්‍රේෂ්ඨාධිකරණය
    2. මහාධිකරණ
    3. දිසා අධිකරණ සහ
    4. මහේස්ත්‍රාත් අධිකරණ
- 1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතේ සඳහන් විධිවිධාන මගින් යුක්තිය පසිඳලීම පිණිස ශ්‍රී ලංකාව කලාප 16 කට බෙදනු ලැබිණි. මේ එක් එක් කලාපය තුල මහාධිකරණය බැගින් ද, මේ එක් එක් කලාපය දිසා වලට බෙදා එක් දිසාවක් සඳහා දිසා අධිකරණය බැගින් ද, එක් එක් කලාපය කොට්ඨාශ වලට බෙදා එක් එක් කොට්ඨාශයෙහි මහේස්ත්‍රාත් අධිකරණය බැගින් ද පිහිටුවන ලදි.

www.alevelapi.com

**නිගමනය (ලකුණු 02)**

1972 ව්‍යවස්ථාව යටතේ නව අධිකරණ ව්‍යුහයක් ස්ථාපිත කෙරුණු අතර අධිකරණ සේවා උපදේශක මණ්ඩලයක් සහ අධිකරණ සේවා විනය මණ්ඩලයක් ඇති කිරීම විශේෂතාවක් වශයෙන් දක්වා තිබීම වැදගත්ය. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීති විවරණය කිරීමේ බලය ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය'' යන නව ආයතනයට පැවැරීම විශේෂ ලක්ෂණයක් වේ. මෙය මුළු අධිකරණ ව්‍යුහයේම ඇති වූ ප්‍රතිසංස්කරණයකි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 7. iv 1978 ව්‍යවස්ථාව යටතේ අධිකරණය

**අභිමතාර්ථ**

මෙම පිළිතුරෙන් අපේක්ෂා කරනුයේ 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කරන ලද අධිකරණමය ව්‍යුහය සහ එහි සුවිශේෂතා පිළිබඳව සිසුසිසුවියන්ගේ දැනුම පරීක්ෂා කර බැලීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන ආ 17 සහ 19 සංශෝධන මගින් අධිකරණ ව්‍යුහයට සහ එහි බල පරාසයට කරන ලද වෙනස්කම් පිළිබඳවද අවධානය යොමු කර තිබීම අවශ්‍යය.

**හැඳින්වීම (ලකුණු 02)**

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එතෙක් පැවැති අධිකරණ පද්ධතියේ වෙනස්කම් ගණනාවක් සිදු කරන ලදී. 1978 මුල් ව්‍යවස්ථාවට ගෙන ආ සංශෝධන මගින් අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා විවිධ ප්‍රතිපාදන හඳුන්වා දී ඇත.

**සාකච්ඡාව (ලකුණු 06)**

- 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1978 අංක 2 දරණ අධිකරණ විධිවිධාන පනත මගින් හඳුන්වා දුන් අධිකරණ පද්ධතිය පහත පරිදි වේ.
    1. ශ්‍රේෂ්ඨාධිකරණය
    2. අභියාචනාධිකරණය
    3. මහාධිකරණය
    4. දිස්ත්‍රික් උසාවි
    5. මහේස්ත්‍රාත් උසාවි
    6. ප්‍රාථමික උසාවි
- මේ අතරින් ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය සහ මහාධිකරණය ඇතුලු අනෙකුත් උසාවි පහළ අධිකරණ ලෙසත් හඳුනා ගැනේ. මෙය අධිකරණ ව්‍යුහයේ ප්‍රතිසංස්කරණයක් ද විය.
- ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය ලේඛනෝපගත කිරීමේ ජ්‍යෙෂ්ඨ අධිකරණ වේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතාවගේ අධිකරණ බලය අධිකරණ විනිශ්චය අධිකාර සහ ආයතන මගින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුතුය.
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන ආ 17 සහ 19 සංශෝධන මගින් ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරු සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට තිබූ බලතල සංවරණය කර ඇත. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ශ්‍රේෂ්ඨාධිකරණ



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීම හා සම්බන්ධව කර්තව්‍ය ඉටු කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අග්‍ර විනිශ්චයකාරවරයාගේ අදහස් ලබා ගත යුතුය.

- අග්‍ර විනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ විනිශ්චයකාරවරයන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන් පත් කිරීමේදී ජනාධිපතිවරයාගේ නිර්දේශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අනුමත කර ඇත්නම් මිස ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තෙකු පත් නොකළ යුතුය.
- අධිකරණ සේවා කොමිෂන් සභාව අග්‍ර විනිශ්චයකාරවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරන ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරුන් දෙදෙනාගෙන් සමන්විත විය යුතුය.
- අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් දඩ නියම කිරීමට සහ බන්ධනාගාරගත කිරීමට හැකියාව ලබා දීම අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම වෙනුවෙන් ගෙන ආ ප්‍රතිපාදනය.
- පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව බහුතර කැමැත්තෙන් යෝජනාවක් සම්මත කර ජනපති නියමයෙන් ඉහළ අධිකරණ විනිශ්චයකාරවරයෙකු ඉවත් කළ හැකිය.
- ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාමික වයස අවුරුදු 65ක් ලෙස දක්වා ඇති අතර, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාමික වයස අවුරුදු 63 කි.
- ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවන්ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය.
- මුල් අවස්ථා අධිකරණවල නියෝජ්‍ය පිස්කල්වරු අධීක්ෂණය කිරීමට මුළු දිවයිනම සඳහා පිස්කල්වරයෙකු සිටිය යුතුය.
- අධිකරණ කටයුතු වලට අයුතු ලෙස මැදිහත් වීම වරදක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇත.

**නිගමනය (ලකුණු 02)**

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ අධිකරණ ව්‍යුහය සහ බලතල ප්‍රතිසංස්කරණයකට බඳුන් වූ අතර, එම ව්‍යවස්ථාවට ගෙන ආ 17 සහ 19 සංශෝධන තුළින් අධිකරණයේ ස්වාධීනත්වය සුරැකීම සඳහා සංවරණ යාන්ත්‍රණයන් හඳුන්වා දී ඇත. මේ මගින් අධිකරණයට බලපෑම් කිරීමට ජනාධිපතිවරයාට තිබූ බලතල සීමා කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කැපී පෙනෙන භූමිකාවක් පවරා තිබේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**8.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(i) සාක් සංවිධානය සහ කලාපීය සහයෝගීතාව
(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක සාමය
(iii) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩගස්වන සාධක
(iv) ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ලෝක දේශපාලනය තුළ ඉටු කරන භූමිකාව

**අරමුණු**

මෙම ප්‍රශ්නය පහත කරුණු තක්සේරු කිරීම අරමුණු කරයි;

- ලෝක දේශපාලනයේ ස්වභාවය හා ගතිකතාවන් පිළිබඳ සිසුන්ගේ අවබෝධය.
- දකුණු ආසියානු කලාපීය සහයෝගීතාව අරබයා සාර්ක් සංවිධානයේ කාර්යභාරය, ජයග්‍රහණ සහ අසාර්ථකත්ව පිළිබඳ සිසුන්ගේ දැනුම.
- ලෝක සාමය හා සාමය පවත්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හි කාර්යභාරයේ වැදගත්කම පිළිබඳ සිසුන්ගේ දැනුම.
- අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන (INGO) පිළිබඳ මුඛ්‍ය අවධානය සහිතව ලෝක දේශපාලනයේ රාජ්‍ය නොවන කතෘකයින් පිළිබඳ සිසුන්ගේ දැනුම.
- ලබා දී ඇති මාතෘකා හතරෙන් දෙකක් තෝරාගෙන අදාළ මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලිවිය යුතුය.

**8. i. සාර්ක් සහ කලාපීය සහයෝගීතාව.**

**හැඳින්වීම (ලකුණු 02)**

- දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානය (SAARC -සාර්ක්) යනු 1985 දෙසැම්බර් 8 වන දින පිහිටුවන ලද දකුණු ආසියානු ජාතීන්ගේ සංවිධානයකි.
- එහි ආරම්භක සාමාජිකයන් හත් දෙනා වූයේ ශ්‍රී ලංකාව, ඉන්දියාව, භූතානය, මාලදිවයින, නේපාලය, පාකිස්තානය සහ බංග්ලාදේශය වන අතර 2007 දී ඇෆ්ගනිස්ථානය එම සංවිධානයට සම්බන්ධ විය.
- සාර්ක් සංවිධානය පිහිටුවන ලද්දේ දකුණු ආසියාව තුළ කලාපීය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙනය.

**සාකච්ඡාව (ලකුණු 06)**

- සාර්ක් ප්‍රඥප්තියේ (සංවිධානයේ ව්‍යවස්ථාව) I වන වගන්ති සාර්ක් සංවිධානයේ අරමුණු ප්‍රකාශ කරයි.ඒවා කලාපීය සහයෝගිතාව සඳහාවන අරමුණු ද වේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

අ) දකුණු ආසියාවේ ජනතාවගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම;

ආ) කලාපයේ ආර්ථික වර්ධනය, සමාජ ප්‍රගතිය සහ සංස්කෘතික සංවර්ධනය

වේගවත් කිරීම.

ඇ) දකුණු ආසියාවේ රටවල් අතර සාමූහික ස්වයං විශ්වාසය වර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම;

ඈ) අන්‍යෝන්‍ය විශ්වාසය, අවබෝධය සහ අගය කිරීම සඳහා දායක වීම.

ඉ) ආර්ථික, සමාජ, සංස්කෘතික, තාක්ෂණික හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල ක්‍රියාකාරී සහ අන්‍යෝන්‍ය සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම,

යන මේවා එම අරමුණු අතර වැදගත් ය.

- සාර්ක් ප්‍රඥප්තියේ II වන වගන්තිය සාර්ක් හි මූලධර්ම ඉස්මතු කරයි. ඒවාද කලාපීය සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් ඒවාය. සාමාජික රටවල් අතර සෛවරී සමානත්වය, භෞමික අඛණ්ඩතාව හා වෙනත් රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීම ඒවා අතර වැදගත්ය.

ආර්ථික, වෙළඳ හා මූල්‍ය සහයෝගීතාව

- සාමාජික රටවල් අතර ආර්ථික, වාණිජ සහ මූල්‍ය සහයෝගිතාව වර්ධනය කිරීම ද සාර්ක් සංවිධානයෙන් අපේක්ෂා කෙරේ. මේ අරමුණ ඇතිව සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම
(SAPTA) සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ කලාපය (SAFTA) ගිවිසුම් වැදගත් ය.
- Integrated Programme of Action (IPA) - ඒකාබද්ධ ක්‍රියාකාරී වැඩසටහන හරහා සහයෝගීතාව, තවත් ආර්ථික සහයෝගිතා පියවරකි.
- ඉහත ක්ෂේත්‍ර හැරුණු විට දරිද්‍රතාව පිටුදැකීම, ආරක්ෂාව සහ ත්‍රස්තවාදයට එරෙහි මුලපිරීම, සාෆ් (දකුණු ආසියානු ක්‍රීඩා) මගින් ක්‍රීඩාවට සහයෝගය දැක්වීම සහ සංස්කෘතික සහයෝගිතාව සාර්ක් විසින් නිර්මාණය කරන ලද කලාපීය සහයෝගීතාවට සාක්ෂි සපයයි.

කලාපීය සහයෝගීතාව ගොඩනැගීමේදී සාර්ක්හි ජයග්‍රහණ සහ අසාර්ථකත්වය පිළිබඳ තක්සේරුවක් පහත දැක්වෙන පරිදි මෙම නිගමනයට ඉදිරිපත් කළ හැකිය.

- විවිධ අංශවල ප්‍රමාණාත්මක ජයග්‍රහණ අත්කරගෙන ඇති නමුදු, කලාපීය සහයෝගීතාව එහි මූලික අරමුණු ලෙස වර්ධනය කිරීමේ සාර්ථක වේදිකාවක් ලෙස සාර්ක් ඉස්මතු වී නොමැත. එම අසාර්ථකත්වයට බලපෑ හේතු කිහිපයක් නිරීක්ෂණය කළ හැකි වේ.
- අන්තර්-රාජ්‍ය ආරවුල් විසඳීමට හෝ මැදිහත් වීමට නෛතික ශක්තියක් සංවිධානය සතු නොවේ. මෙයට හේතු වී ඇත්තේ දේශපාලනික වශයෙන් විවාදාපන්න කාරණා සංවිධානයේ ප්‍රඥප්තිය විසින්ම බැහැර කරනු ලැබීමයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- ඉන්දියාවේ "බලසම්පන්න අසල්වැසියාගේ (Big Brother) හැසිරීම" පිළිබඳ භීතිය කලාපීය සහයෝගීතාව සහ ඒකාබද්ධතාව කෙරෙහි නිශේධනාත්මක බලපෑමක් ඇති කර තිබේ.
- ඉන්දියාව සහ අනෙකුත් සාමාජික රටවල් අතර පවත්නා අසමමිතිය හෝ බල අසමතුලිතතාව කුඩා රටවල් සංවිධානය තුළ කරන හැසිරීමෙහිදී අවධානය යොමු කරන ප්‍රමුඛ කාරණයක් ලෙස ඉස්මතු වී ඇත.
- සාමාජික රටවල් අතර වෙනස් දේශපාලන ක්‍රම සහ සමාජීය ක්‍රම, සාර්ක් සාමාජිකයන් අතර සමානතාවන්ට වඩා අසමානතා නිර්මාණය වීමට බලපා තිබේ.

**නිගමනය (ලකුණු 02)**

සාර්ක් සංවිධානය, දකුණු ආසියාවේ කලාපීය සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන පිහිටුවීම, දකුණු ආසියාතික දේශපාලනයේ සාධනීය පියවරක් විය. එහෙත්, දකුණු ආසියාවේ දේශපාලන යථාර්ථයන් විසින් එම ඉලක්කවලට බාධා පමුණුවා තිබේ. මෙය සාර්ක් සංවිධානයේ සාමාජික රටවල් ද දිගින් දිගටම මුහුණ දෙන අභියෝගයක් වී තිබේ.

**8. ii. එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක සාමය.**

**හැඳින්වීම (ලකුණු 02)**

- එක්සත් ජාතීන්ගේ සංවිධානය 1945 දී පිහිටුවන ලද්දේ "අනාගත පරම්පරාවන් යුද්ධයේ ව්‍යසනයෙන් ගලවා ගැනීම සඳහා" වන අතර එහි එක් මුඛ්‍ය අරමුණක් වන්නේ ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වා ගැනීමයි.
- එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මගින් අන්තර්ජාතික සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාමේ මූලික වගකීම ආරක්ෂක කවුන්සිලයට ලබා දී ඇත.
- මෙම වගකීම ඉටු කිරීමේදී, කිසියම් ලෝක කලාපයක සාමයට තර්ජනයක් වන ඕනෑම අවස්ථාවක, ආරක්ෂක කවුන්සිලයට එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් ඇතුළු විධික්‍රම ගණනාවක් අනුගමනය කරමින් ලෝක සාමය ප්‍රතිස්ථාපනය සඳහා පියවර ගැනීමේ බලය පවරා තිබේ.
- ආරක්ෂක කවුන්සිලයට සිය තීරණ බලාත්මක කිරීම සඳහා වෙළඳ තහනම වැනි සම්බාධක පිළිබඳව ද තීරණ කළ හැකිය. ආරක්ෂක කවුන්සිලය එවැනි ක්‍රියාවලියක් සබැඳි සිය අභිමතය ප්‍රකාශයට පත් කරන්නේ අදාළ කලහකාරී රාජ්‍යයට එරෙහි යෝජනා සම්මතකිරීම මගිනි. .



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- එක්සත් ජාතීන්ගේ සාමය ප්‍රතිස්ථාපනය සඳහා භාවිත විවිධ විධික්‍රම ගැටුම්වල විවිධ අවස්ථා වලදී භාවිත වේ. මෙම විධික්‍රම;
    - ➢ ගැටුම් වැළැක්වීම,
    - ➢ සාමය ඇති කිරීම,
    - ➢ සාමය පවත්වා ගැනීම,
    - ➢ සාමය ගොඩනැගීම, සහ
    - ➢ සාමය බලාත්මක කිරීම, ලෙස හඳුනාගත හැකිය.

**සාකච්ඡාව (ලකුණු 06)**

ලෝක සාමය පවත්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ආයතනික ශක්‍යතා;

**ආරක්ෂක කවුන්සිලය (Security Council)**

සාමයට තර්ජනයක් හෝ ආක්‍රමණශීලී ක්‍රියාවක පැවැත්ම හඳුනාගැනීමෙහි ලා ආරක්ෂක කවුන්සිලය මූලිකත්වය ගනී. එය ආරවුලක පාර්ශවයන්ගෙන් ගැටුම සාමකාමී ආකාරයකින් විසඳා ගැනීම සඳහා ඉල්ලා සිටින අතර ඒ සඳහා නම්‍යතා විධි මෙන්ම නිරවුල් කිරීමේ කොන්දේසි නිර්දේශ කරයි.

**එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය (General Assembly)**

එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදක සහ නියෝජිත ආයතනය වන්නේ මහා මණ්ඩලය යි. ලෝක සාමය පවත්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ මහා මහා මණ්ඩලයට ඍජුවම පවරා ඇති රාජකාරි නොමැති වුවද, සාමය පවත්වා ගැනීමට ආරක්ෂක මණ්ඩලයට පහසුකම් සපයයි.

www.alevelapi.com

එක්සත් ජාතීන්ගේ සංවිධානය ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගන්නේ කෙසේද?

- ✓ ගැටුම් වැළැක්වීම සහ සාමය ඇති කිරීම.
    - ගැටුම් වළක්වා ගැනීමට සහ සාමකාමීව විසඳීමට ජාතීන්ට උපකාර කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය ගැටුම් නිවාරණ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවන අතර මැදිහත්කරණ විධික්‍රම භාවිත කරයි.
- ✓ සාම සාධනය
    - අන්තර් රාජ්‍ය සටන් විරාම හෝ සාම ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් යොදා ගැනේ.
    - දේශපාලන ක්‍රියාදාමයට පහසුකම් සැලසීම, සිවිල් වැසියන් ආරක්ෂා කිරීම, නිරායුධ කිරීම සහ හිටපු සටන්කාමීන් නැවත සමාජගත කිරීම සඳහා සහාය වීම;



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

මැතිවරණ සංවිධානය කිරීමට සහාය වීම, මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහ නීතියේ ආධිපත්‍යය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සාම සාධන ක්‍රියාකාරකම් සහාය වේ.

✓ සාමය ගොඩනැගීම

- යුද්ධයෙන් විනාශ වූ සමාජයන්හි කල්පවත්නා සාමයක් ගොඩනැගීම ගෝලීය සාමය හා ආරක්ෂාව සඳහා ඇති අභියෝගයන්ගෙන් එකකි. සාමය ගොඩනැංවීමේ අභියෝග වඩාත් හොඳින් අපේක්ෂා කිරීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා එක්සත් ජාතීන් 2005 දී සාමය ගොඩනැගීමේ කොමිසම (Peace Building Commission) පිහිටුවන ලදී.

✓ නිරායුධකරණය සහ ආයුධ පාලනය

✓ මෙම අරමුණු අතර න්‍යෂ්ටික අවි අවම කිරීම හා අවසානයේදී තුරන් කිරීම, රසායනික අවි විනාශ කිරීම සහ ජීව විද්‍යාත්මක ආයුධ තහනම් කිරීම ශක්තිමත් කිරීම, බිම් බෝම්බ, කුඩා ආයුධ සහ සැහැල්ලු ආයුධ ව්‍යාප්ත වීම වැළැක්වීම ප්‍රධාන වේ.

✓ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන විධික්‍රම ගණනාවක් මෙම උත්සාහයන්ට සහාය වේ. සියලු බහුපාර්ශ්වික නිරායුධකරණ ගිවිසුම් අතුරින් වඩාත්ම විශ්වීය වන, න්‍යෂ්ටික අවි ව්‍යාප්ත වීම වැළක්වීමේ ගිවිසුම (NPT) 1970 දී බලාත්මක විය. රසායනික අවි සම්මුතිය 1997 දී සහ ජීව විද්‍යාත්මක අවි සම්මුතිය 1975 දී බලාත්මක විය .

✓ කාන්තාව, සාමය සහ ආරක්ෂාව

✓ ත්‍රස්තවාදය මර්දනය කිරීම

www.alevelapi.com

**නිගමනය (ලකුණු 02)**

ලෝක සාමය හා සුරක්ෂිතතාව පවත්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ කාර්යභාරය පිළිබඳ තක්සේරුවක් මෙම නිගමනයට ඇතුළත් විය යුතුය. එහි උපරිම උත්සාහයෙන් වුවද ප්‍රචණ්ඩ අන්තර් රාජ්‍ය යුද්ධ සහ අභ්‍යන්තර ගැටුම් ඇති වී ඇති බවට විවේචන තිබේ. මෑත දශක කිහිපය තුළ අප්‍රිකාව, යුරෝපය සහ ආසියාව තුළ ජන සංහාර වැළැක්වීමට එක්සත් ජාතීන්ගේ අසමත් වීම කෙරෙහි බරපතල අවධානය සහ විවේචන එල්ල වී ඇත. අවසාන විග්‍රහයේදී පැවසිය හැකි වන්නේ, අසාර්ථකතා සහ පසුබෑම් මතුයෙහි වුවත්, ලෝක සාමය සහ සුරක්ෂිතතාව පවත්වාගෙන යාම සඳහා ඒකායන ලෝක පරිමාණ ආයතන ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය තව දුරටත් පවතින බවයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 8. iii. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සකස් කරන සාධක.

**හැඳින්වීම (ලකුණු 02)**

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සාමාන්‍යයෙන් තීරණය වන්නේ ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය සාධක මත ය. මෙය ඇත්ත වශයෙන්ම ලෝකයේ බොහෝ රටවලට පොදු ය. කෙසේ වෙතත්, විදේශ ප්‍රතිපත්තිය සකස් කරන සාධක දේශීය සාධක සෑම විටම ඒ ඒ රාජ්‍යයන්ගේ සමාජ, දේශපාලනික, ආර්ථික සහ ඓතිහාසික තත්ත්වයන් අනුව විශේෂිත වේ.

**සාකච්ඡාව (ලකුණු 06)**

<u>අභ්‍යන්තර සාධක</u>

**භූ-දේශපාලනික පිහිටීම**

- ✓ ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ වැදගත් ස්ථානයක මධ්‍යගතව පිහිටා ඇත.
- ✓ ඉන්දියාවට එහි පවතින සමීපත්වය පශ්චාත් - නිදහස් ඉතිහාසය පුරාම විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කිරීමෙහි ලා බෙහෙවින් බලපා තිබේ.
- ✓ සාගරික සේද මාවත වැනි නව්‍ය උපායමාර්ගික ප්‍රතිපත්ති සඳහා සංවේදී කලාපයක ශ්‍රී ලංකාව ස්ථානගත වී ඇත.

**පාලන තන්ත්‍රයේ දේශපාලන අභිලාශ.**

- ✓ නූතන රාජ්‍යයන් හි විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමේදී පාලක තන්ත්‍රයන්ගේ සහ දේශපාලන ප්‍රභූන්ගේ දේශපාලන අභිලාශ ද බලපායි.
- ✓ එක්සත් ජාතික පක්ෂ පාලන සමයේදී ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ගෝලීය දේශපාලන හා ආර්ථික ප්‍රවණතාවන්ට විවෘත විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයෙන් යුත් පාලන තන්ත්‍ර සම්බන්ධයෙන් ගත් කල, මුලදී විදේශ ප්‍රතිපත්ති උපාය මාර්ග සකස් වූයේ නොබැඳි මූලධර්ම මත වන අතර පසුකාලීනව ලෝක දේශපාලන සහ දෘෂ්ටිවාදී වෙනස්කම්වලට සාපේක්ෂව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන්ට සමාන්තරව පැවති විවෘත උපාය මාර්ගයන්ට නම්‍යශීලීව බව හඳුනාගත හැකිය.

**මහජන මතය.**

- ✓ විදේශ ප්‍රතිපත්තිය රාජ්‍යයන් හි අභ්‍යන්තර ප්‍රතිපත්තියේ දිගුවක් ලෙස අඩු හෝ වැඩි වශයෙන් හඳුනාගෙන ඇත.
- ✓ විදේශ ප්‍රතිපත්ති තීරණය කිරීමේදී මහජන මතය කෙරෙහි පාලන තන්ත්‍ර බොහෝ විට නම්‍යශීලී බවක් පෙන්නුම් කර ඇත.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ජාතික බලය**

රටක ජාතික බලය යනු භෞතික, මානව හා දෘෂ්ටිවාදාත්මක සම්පත් වල එකතුවකි. ජාතික බලයේ නිර්ණායකයන්ගෙන් පොහොසත් වන ජාතීන්ට ගෝලීය වේදිකාවේ ප්‍රබල ප්‍රතිපත්තිමය ස්ථාවරයන් දියත් කළ හැකිය. එනයින් කුඩා භූමි ප්‍රදේශයක් සහිත සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවට විදේශ ප්‍රතිපත්තිය තුළින් ගෝලීය පද්ධතියට කළ හැකි බලපෑම ඉතා සීමිත වන්නේය.

බාහිර සාධක.

- ✓ **කලාපීය බල තුලනය**

  කලාපීය බල සමතුලිතතාව බොහෝ විට ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සැකසීමට බලපායි. විශේෂයෙන් ඉන්දියාවේ දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික ස්ථාවරය මෙම සන්දර්භය තුළ වැදගත් සාධකයක් බවට පත් වේ.

- ✓ **ජාත්‍යන්තර බල තුලනය.**

  වර්තමාන බහු ධ්‍රැවීය තුලනයේ ස්වභාවය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමේදී සෘජු බලපෑමක් ඇති කරයි. බල කේන්ද්‍ර කිහිපයක් ගෝලීය අවකාශයේ එකිනෙකට තරගකාරීව හැසිරීම හේතුවෙන්, මෑත කාලයේ ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය යම් සමතුලිතතාවකින් ක්‍රියාත්මක කෙරේ. කුඩා රටක් ලෙස ශ්‍රී ලංකාවට ලෝක පද්ධතියේ සියලුම බල මධ්‍යස්ථාන සමඟ මෘදු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වා ගත යුතුව තිබේ.

- ✓ **ජාත්‍යන්තර දේශපාලන ආර්ථිකය.**

  නව ලිබරල් ආර්ථික හා දේශපාලන පරමාදර්ශ ගෝලීය වේදිකාවේ බලයේ ඇති හෙයින්, ආර්ථික රාජ්‍යතාන්ත්‍රික සබඳතා (Economic Diplomacy) යනු ශ්‍රී ලංකාවේ මෑත කාලීන විදේශ ප්‍රතිපත්තියේ වඩාත්ම කැපී පෙනෙන මතවාදය බවට පත් වී ඇත්තේය.

**නිගමනය (ලකුණු 02)**

ඇතැම්විට පාලනතන්ත්‍ර සුවිශේෂ දෘෂ්ටීන් සහිතව විදේශ ප්‍රතිපත්ති මෙහෙයවුවද, සමස්තයක් ලෙස සමාන්තරව ගලනය වන විදේශ ප්‍රතිපත්තියක් මෑත කාලීනව ශ්‍රී ලංකාව කෙරෙන් දෘශ්‍යමාන වේ. කෙසේවෙතත්, ගෝලීය දේශපාලන යතාර්ථයන් මත අභ්‍යන්තර සහ බාහිර සාධක සමතුලනය කිරීම කෙරෙහි බල කෙරී ඇති බව අවසාන විග්‍රහයේදී පැවසිය හැකි ය.



www.alevelapi.com
උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 8. iv. ලෝක දේශපාලනය තුළ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල කාර්යභාරය.

**හැඳින්වීම (ලකුණු 02)**

වර්තමාන ලෝක දේශපාලනයේ ප්‍රබල කාර්යභාරයක් ඉටු කරන රාජ්‍ය නොවන කර්තෘකයින් විශේෂයක් ලෙස ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGO) සලකනු ලැබේ. මේවා රාජ්‍ය අවකාශයෙන් පිටත ක්‍රියාත්මක වන සංවිධාන වේ.

**සාකච්ඡාව (ලකුණු 06)**

- එක්සත් ජාතීන්ගේ අර්ථ දැක්වීම අනුව, රාජ්‍ය නොවන සංවිධාන පෞද්ගලික අංශයේ පුරෝගාමිත්වයෙන් ස්ථාපිත වේ. රාජ්‍යයන්ගෙන් ස්වාධීන; නීතියේ ආධිපත්‍යය දෙසට නැඹුරු; පෞද්ගලික අවශ්‍යතා වෙනුවට පොදු අවශ්‍යතා කෙරෙහි නම්‍යශීලී; අන්තර්ජාතික විෂය පථයක් නිරූපණය කරන; [අවම වශයෙන්] සාමාන්‍ය සංවිධාන ව්‍යුහයක් සහිත සංවිධාන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් අර්ථකථනය කෙරේ.
- එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලය (ECOSOC) අර්ථ දක්වන්නේ "අන්තර් රාජ්‍ය ගිවිසුමක් මගින් ස්ථාපිත කර නොමැති, රාජ්‍යයන්ට ද නිලධාරීන් පත්කිරීමට අවකාශ සහිත, එහෙත් එම පත් කිරීම් හෝ නිලධාරීන් සංවිධානයෙහි නිදහස් මතය දැරීමට බාධාකාරී නොවන සංවිධාන ද ඇතුළු ජාත්‍යන්තර ආයතන විශේෂයක්" වශයෙනි.
- ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන යනු ආධාර සැපයීමේ ප්‍රබල ශක්‍යතා සහිත එනිසාම ජාත්‍යන්තර සංවර්ධන ක්‍රියාදාමය තුළ වැදගත් භූමිකාවක් සහිත කර්තෘකයින් කොටසකි.
- අන් කවරදාකටත් වඩා වර්තමානයේ ඔවුන් සංවර්ධනය වන රටවලට වැඩි ආධාර සපයන අතර, විශේෂයෙන් විශාල රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රාග්ධන සංචිතය ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වන සමහර සංවිධානවල මෙන්ම ආධාර සපයන ඇතැම් රටවල ජාතික ධනය ද අභිබවා ගොස් ඇත.
- ගෝලීය අවකාශය තුළ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වර්ධනය වීමට හේතු සාධක විය;

  (අ) ජාතික රාජ්‍යයේ පරිහානිය - රජය කෙරෙහි ඇති විශ්වාසය බිඳ වැටීම, රාජ්‍ය අංශයේ සම්පත් පහත වැටීම, පුද්ගලීකරනය, අසාර්ථක රාජ්‍යයන්.

  (ආ) අන්තර් ජාතික ගෝලීයකරණය වූ ලෝක පද්ධතියේ මතුවීම.

  (ඇ) බහුජාතික සමාගම් නිර්ජාතිකකරණයට ලක්වීම.

  (ඈ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වර්ධනය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඉ) සීමිත ආණ්ඩුවක් යෝජනා කරන නව ලිබරල් ලෝක පර්යායේ ආධිපත්‍යය.

(ඊ) ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රිකත්වයේ වර්ධනය.

- ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ස්වාධිපත්‍ය ආයතන නොවුවද, අන්තර්ජාතික, ජාතික සහ දේශීය ප්‍රතිපත්තියට බලපෑම් කිරීමේ විශාල හැකියාවක් ඇති අතර බොහෝ අවස්ථාවන්හිදී එම විභවය පෙන්නුම් කර ඇත.
- දේශීය වශයෙන් නිර්වචනය කරන ලද ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී රජයක සාර්ථකත්වය රඳා පවතින්නේ නව අන්තර්ජාතික ආයතන ඇතුළු ජාත්‍යන්තර සන්දර්භයේදී කොපමණ සාර්ථකව සබඳතා හසුරුවන්නේද යන සාධකය මතයි.
- අද වන විට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ලෝකයේ මුලු සංවර්ධන ප්‍රාග්ධනයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 10 ක් පමණ අත්කරගෙන ඇත.
- ලෝක දේශපාලනයට රාජ්‍ය නොවන සංවිධානවල බලපෑම;

(අ) ප්‍රතිපත්ති සම්පාදනය සඳහා යෙදවුම් සැපයීම

(ආ) සේවා ප්‍රතිපාදන, ධාරිතා වර්ධනය සහ ආයතනික බලපෑම්

(ඇ) ප්‍රතිපත්ති හැඩගැස්වීම. මෙය සිදුවන්නේ මූල්‍ය සහ තාක්ෂණික පහසුකම් සැළසීමෙනි.

(ඈ) අධීක්ෂණය - පාරිසරික ආරක්ෂාව සහ මානව හිමිකම් සම්බන්ධයෙන් අධීක්ෂණ යාන්ත්‍රණ වශයෙන් ක්‍රියාත්මක වේ.

**නිගමනය (ලකුණු 02)**

- බොහෝ රාජ්‍ය නොවන සංවිධාන පදනම් වී ඇත්තේ ගෝලීය උතුරේ හෝ ගෝලීය ප්‍රාග්ධනයේ නිදහස් ගලනය තුළිනි. බලගතු රාජ්‍ය නොවන සංවිධානවලින් බොහොමයක් නව ලිබරල් ආර්ථික හා සමාජ අරමුණු වල මතය ගෙනයන්නන් ලෙස කටයුතු කරයි.
- ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල විෂය පථය නව ලිබරල් පරමාදර්ශ සමඟ හැඩගැසී ඇත. ඔවුහූ පහසුවෙන් රාජ්‍යයන්ගේ ජාතික දේශසීමා විනිවිද ගොස් සංවර්ධන ක්‍රියාවලියේ අනිවාර්ය පාර්ශවකරුවෙකු බවට පත්වීමට උත්සාහ කරති.
- ඌණ සංවර්ධිත රටවල සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රාග්ධන හා තාක්ෂණික හැකියා හිඟයක් ඇති හෙයින්, සංවර්ධන අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාගත කිරීමේදී ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන බලපෑම් සහගත භූමිකාවක් රඟ දක්වයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .